*සැ. යු.* - 2010.06.11 දින පළවූ අංක 1658 දරන *ගැසට් පත්‍රයේ* I-III, II සහ III කොටස් පළ නොවීය.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2009 වර්ෂයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමලේඛණයක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,659 - 2010 ජුනි මස 18 වැනි සිකුරාදා - 2010.06.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1136 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1137 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1141 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජුනි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජුනි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 87

**ජාතික ශිෂ්‍යභට බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

2009 අගෝස්තු මස 30 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන් :

නි/3074 කපිතන් එච්කේජ් දයාකාන්ති (ගැ)
නි/3526 කපිතන් කේඩී ද සිල්වා
නි/3905 කපිතන් එච්එම්එම්සී බණ්ඩාර
නි/3964 කපිතන් ආර්එම්කේබී ඇඹව
නි/4158 කපිතන් එල්ඩබ් මලලගම
නි/4199 කපිතන් කේඑම්ඩී රත්ජන්
නි/4314 කපිතන් එම්එස් මෙන්ඩිස්
නි/4517 කපිතන් ජේකේ රොබට්සන්
නි/4537 කපිතන් කේඑම්ආර් කෝනාර
නි/4574 කපිතන් ඩීඑම්එම්ජී දිසානායක
නි/4706 කපිතන් බීඑම් ගුණනන්දසිරි
නි/4711 කපිතන් ජේසී බමුණුසිංහආරච්චි
නි/4729 කපිතන් ඩීඑම් සුගතපාල
නි/4822 කපිතන් කේසී ජගත් කුමාර
නි/4710 කපිතන් ඩීජ්ආර් උපනන්ද

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010,
කොළඹ දී ය.

06-381

---

2010 අංක 88

**ජාතික ශිෂ්‍යභට බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් මහත්ම මහත්මීන් 2009 සැප්තැම්බර් මස 15 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨත්වය අනුව ජාතික ශිෂ්‍යභට බළකායේ දෙවැනි ලුතිතන්වරුන් වශයෙන් අධිකාරියට පත් කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකර ඇත.

1. අබ්දුල් ගෆූර් නදියා මෙනවිය
2. අබ්දුල් කාදර් මුස්තරී කන්සුල් ජෙමිලා බේගම් මෙනවිය
3. කිරියාදුරගේ මදුෂානි ශෂිකා ප්‍රේමරත්න මෙනවිය
4. දවුලගල වියන්මල් ගෙදර අසංක ලාල් සෙනවිරත්න මහතා
5. මීරාසායිබු මුහම්මදු රිස්වාන් මහතා
6. චාමලි දිමුතු මාලා කමල්සිරි මෙනවිය
7. නායකරත්න මුදියන්සේලාගේ ඉෂන්බා සඳරේබා මෙනවිය
8. වහාබු මොහමඩ් සමීර් මහතා
9. නවරත්න මුදියාන්සේලාගේ කමතේ ගෙදර සමන් නවරත්න බණ්ඩාර මහතා
10. ඇඹුල්දෙනිය අසිරිංගලාගේ මධුෂා ජීවනී ප්‍රසාදිකා මහවිල මෙනවිය
11. සිරිමාන්නගේ සිදත් රන්ජන් සිරිමාන්න මහතා
12. කනමීවල රත්නායක මුදියන්සේලාගේ නිස්සංඛ බංඩාර කනමීවල මහතා
13. මුදුන්කොත්ගේ නිශානි රෝෂිකා විජේරත්න මෙනවිය
14. අබ්දුල් හමීඩ් මුහම්මද් හිස්නි හමීඩ් මහතා
15. විදාන හේනලාගේ චානක සම්පත් කුමාරසිරි මහතා
16. අලුත්ගේ දෝන කුමුදු අනුෂා ලක්මාලි පියතිස්ස මෙනවිය
17. හඳුන්කිරි කුමාරසිංහ මුදියන්සේලාගේ විමල් නන්දන කුමාරසිංහ මහතා
18. වීරතුංගගේ උදේශිකා මධුෂානි මෙනවිය
19. වික්‍රමසිංහ ආරච්චිලාගේ නාලිකා වික්‍රමසිංහ මෙනවිය
20. අබ්දුල් රසාක් සරුකුල් ෆවුස් මහතා
21. අබ්දුල් රාශීක් මුහම්මදු නිහාල් මහතා
22. දෙහිවල ලියනගේ මහේෂිකා උදයංගනී ලියනගේ මෙනවිය
23. පතිරැන්නැහැලාගේ අසංකා මදුසිකා දිල්රුක්ෂි මෙනවිය
24. වික්‍රමසිංහ කරුණාතිලක මුදියන්සේලාගේ ගීතිකා සුරන්ගනී වික්‍රමසිංහ මෙනවිය
25. රත්නායක මුදියන්සේලාගේ චිත්‍රාංගනී පද්ම කුමාරි කුඹුරේගම මෙනවිය.
26. රත්නායක මුදියන්සේලාගේ දිනූෂා ගයානි රත්නායක මෙනවිය
27. තෙලිසිංහ මුදියන්සේලාගේ ගයත්‍රි තක්ෂිලා තෙලිසිංහ මෙනවිය
28. මායලගු ගනේෂ් කුමාර් මහතා
29. ගම්ලත් හේවාගේ ජනක චින්තක කුමාර මහතා
30. දිසානායක මුදියන්සේලාගේ ලක්මිනි සඳමාලි මෙනවිය
31. හතාලගේ පාලිත චන්ද්‍රලාල් දන්තනාරායන මහතා
32. ජුනෛදීන් සජාතා මෙනවිය
33. අධිකාරි ජයසුන්දර මුදියාන්සේලාගේ නිමාලි නදීෂානී මෙනවිය
34. දිසානායක මුදියන්සේලාගේ රසිකා හර්ෂනී රත්නායක
35. මුහමඩ් මුසම්මෙල් මොහොමඩ් මාහිර් මහතා
36. සිවලිංගම් නේලාමිනෝත් මෙනවිය
37. මුහම්මදු හනීෆා රිෆායා මෙනවිය
38. සේමසිංහ මුදියන්සේලාගේ පිංහාමිගේ නදීරා පියුමාලි සේමසිංහ මෙනවිය
39. දුණුකාර මුදියන්සේලාගේ සකුන්තලා ප්‍රියදර්ශනී මැණිකේ ගුණසේකර මෙනවිය
40. ගල්පැලේ කොටුවේ ගෙදර චතුරංගනී මධාරා කුලතුංග මෙනවිය
41. වික්‍රමසිංහ රොෂාන් නදීෂ වික්‍රමසිංහ මහතා
42. අලුත්ගෙදර සුජානි නිරෝෂා කුමාරි මෙනවිය
43. උදුමා ලෙබ්බේ සම්සුල් නුෂ්හා මෙනවිය
44. ජයසූරිය මුදියන්සේලාගේ අසිත ප්‍රසාද් කුමාර මහතා
45. සේනාරත්න මුහන්දිරම්ලාගේ නදීසා තමාලි ආරියරත්න මෙනවිය
46. රිද්මා අච්නි අලුත්ගමගේ මෙනවිය
47. කරුණා පේලිගේ නිස්සංක ඉන්ද්‍රජිත් ධර්මරත්න මහතා
48. සිංහල පේලි මැදවත්තේ සංජීවනී අනුරශාන්ති කුමාරසිංහ මහතා
49. අලගියවන්න මොහොට්ටාලලාගේ මලින්ති ශිරෝමි ගුණතිලක මෙනවිය
50. අබ්දුල් රහිමාන් රිහාම් මොහමඩ් මහතා
51. වැවල වැහිගල ගෙදර සංධ්‍යා කුමාරි ප්‍රේමසිරි මෙනවිය
52. රාජගුරු මුදියන්සේලාගේ නදීෂා තරංගනී ජයතිලක මෙනවිය
53. රණසිංහ ආරච්චිගේ අනෝජා ලක්මාලි රණසිංහ මෙනවිය
54. ගංගොඩවිලගේ දිල්රුක්ෂි නාලිකා පෙරේරා මෙනවිය

55. ජයලත් මුදියන්සේලාගේ දේවිකා මිහිරානි ජයලත් මෙනවිය
56. තුෂාරි වත්සලා නාරංගස්පිටිය මෙනවිය
57. සරීබු මුහම්මදු ආරිෆු මහතා
58. බෝගහමුල ගෙදර අනුෂ්කා දිල්රුක්ෂි ජයසූරිය මෙනවිය
59. උමර් කත්තා ෆවුසර් මහතා
60. වීරවන්නි මුදියන්සේලාගේ හිමාලි එරංගා වීරවන්නි මෙනවිය
61. මුහම්මඩ් තාහා මුහම්මඩ් තස්නීම් මහතා
62. අලගිය දේවගේ නදීසානි නිරංජලී ප්‍රනාන්දු මෙනවිය
63. අබ්දුල් රහිමාන් ෆාතිමා රිහාමා මෙනවිය
64. ඉෂාක් මුහම්මදු මුන්තාසීර් මහතා
65. වන්සූරිය මුදියන්සේලාගේ සාන්ති මැනිකේ වන්සූරිය මෙනවිය
66. රණසිංහ මුදියන්සේලාගේ මදූෂා ප්‍රබෝදනී මෙනවිය
67. වීරසිංහගේ රසිකා රුවන්මලී වීරසිංහ මෙනවිය
68. සින්නතම්බි ජනනි මෙනවිය
69. හේරත් මුදියන්සේලාගේ අරවින්ද කෝලිත බණ්ඩාර හේරත් මහතා
70. අබ්දුල් අලීම් සිද්දීක් රුෂෛද් අහ්මද් සිද්දීක් මහතා
71. නිසංසලා වීරසිංහ මෙනවිය
72. මැණිකා වෙඩික්කාරයලෑ ගෙදර නිරෝෂා සරෝජනී රණසිංහ මෙනවිය
73. මීරා මුහයිදීන් මුහම්මදු රනීම් මහතා
74. සියඹලාපිටිය විදානෙලාගේ නදීෂා සඳමාලි ජයසිංහ මෙනවිය
75. වික්‍රම පතිරන්නැහැලාගේ ජානක නිමල් ගුණතිලක මහතා
76. අබ්දුල් ගෆූර් මුහම්මදු අහ්සන් මහතා
77. කපුරු බංඩාර ආරච්චිලාගේ චතුරි මදුෂිකා මෙනවිය
78. කාසිම් පාතිමා සබ්රිනා මෙනවිය
79. අහමදු ජුනෛදු සයික්කියා මෙනවිය
80. යාපා බණ්ඩාරලාගේ කුසුමලතා මෙනවිය
81. දොන් රාමනායක ඉසංකා කුමුදුනී මෙනවිය
82. හේරත් මුදියන්සේලාගේ ජයමිණි නිසන්සලා දිසානායක මෙනවිය
83. රත්නායක මුදියන්සේලාගේ අසේල රත්නායක මහතා
84. දිසානායක මුදියන්සේලාගේ වසන්තා ශ්‍යාමලී සිරිවර්ධන මෙනවිය
85. යාපා මුදියන්සේලාගේ චමිලා ලක්මාලි යාපා මෙනවිය
86. අබ්දුල් හකීම් අහමඩ් ආශික් මහතා
87. කොණ්ඩසිංහ පටබැඳි ගෙදර නදීසා දිල්රුක්ෂි නවරත්න මෙනවිය
88. මංගල බණ්ඩාර තිලකරත්න මහතා
89. ජයසිංහ මුදියාන්සේලාගේ ප්‍රභාණි අප්සරා ජයසිංහ මෙනවිය
90. නාගේන්තිරන් සෙල්වම් මහතා
91. කනගරත්නම් ජනර්දන් මහතා
92. උපාලි මධුසංකගේ කෝකිලා සුරන්ගනී පතිරනගේ මෙනවිය
93. වඩිවේල් තර්සිනි මෙනවිය
94. මුහම්මද් සම්සුදීන් ෆාතිමා ඉහුස්සානා මෙනවිය
95. තුඩුගලගේ දොන් තිළිනි කෞශල්‍යා තුඩුගල මෙනවිය
96. උදුමා ලෙබ්බේ මුහම්මදු දිල්ෂාද් මහතා
97. මුහම්මදු අසීස් නිම්සාත් මහතා
98. අබූබකර් මොහොමඩ් අෆ්නාස් මහතා
99. ලෙව්ලේ පටබැඳි ගෙදර ඉරේෂා නිලන්තිකා විමලරත්න මෙනවිය
100. රත්නායක මුදියන්සේලාගේ නාලක බණ්ඩාර අබේරත්න මහතා
101. ආදම් ලෙබ්බේ රෙහානා බානු මෙනවිය
102. කනපදිපිල්ලෙ හේමලා මෙනවිය
103. බාලචන්ද්‍රන් ජාමිනා මෙනවිය
104. හේමාලි කෞශල්‍යා සුගතපාල මෙනවිය
105. සෙනෙවිරත්න මුදියන්සේලාගේ සුභාෂිණී කුමාරි මෙනවිය
106. දිසානායක මුදියන්සේලාගේ තරංගා කුමාරි දිසානායක මෙනවිය

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010,
කොළඹ දී ය.

06-380

# රජයේ නිවේදන

## වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2010 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග පැල්මඩුලු රාජමහා විහාරස්ථ තෙරුවන් පූජෝපහාර පෙරහැර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල-

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති " යන්නෙන් රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී තිබෙන යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධරයා" යන්නට කඳවුර පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද ඇතුළත් වේ.

තවද,

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රත්නපුර පැල්මඩුලු රජමහා විහාරයට අදාළව වාර්ෂික පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුර පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතුය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුර පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීප වන වන්දනාකරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිඟමන් සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුණ්‍ය කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;
(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;
(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහාදැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකිය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවකදී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වළක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කළ හොත්, එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරුවල පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගතවන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද එය ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළ මුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇලක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැළිකසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තකු විසින් කඳවුර පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිකසල දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීම විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යනුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා, වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රිත් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියළුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියළුම ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියළුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේදී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතු ය. එවැනි සියළු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එවැනි සියළු අපද්‍රව්‍ය, කසල හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසල පොලවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැලැක්වීමට අවශ්‍ය සියළුම පූර්වෝපාය යෙදූ බවට සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍ර ලාභියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේ ය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියළු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1/2ට) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසල බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසල තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසල ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතුය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝග වල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුලු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීමද ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැලඳී ඇති සෑම තැනැත්තෙක්ම ද එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැලඳී ඇති බව දැන දැනම ඒ

තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක්ම ද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙලෙන හෝ පෙලෙන්නේ යයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට. කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදා හැරීමේදී, විකිණීමේදී හෝ නිෂ්පාදනය කිරීමේදී හෝ සහභාගී වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පලක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙලෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ භෝජනාගාරයේ, දන්සැලේ නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිණිකෙලි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධාරියා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්-

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම සහ,

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

30 දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්,

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සහ

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වෙලාවක එය එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

### උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පැල්මඩුල්ල නගර ග්‍රාම නිලධාරී වසමේ පැල්මඩුලු රාජමහා විහාරය පිහිටි භූමිභාගය. ඊට මායිම් පහත දැක්වේ.

උතුරට : සොහොලන් ඇල මායිම,
දකුණට : පනාවැන්නේ ගම් ඉම මායිම,
නැගෙනහිරට : ඊරියන්දළු වෙල මායිම,
බස්නාහිරට : කොස්ඕවිටේ වෙල මායිම.

06-425

---

## 1980 අංක 56, 1977 අංක 9, 1976 අංක 18 සහ 1974 අංක 34 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධන) නීතිවලින් සංශෝධිත 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 20 වැනි වගන්තිය යටතේ නිවේදනය

ඉහත කී 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතියේ විධිවිධානයන් ක්‍රියාත්මක වීම හේතුවෙන් මේ සමග ඇති උපලේඛනයේ විස්තරාත්මක ලෙසින් දැක්වෙන නිවස/නිවාස මා වෙත පැවරී ඇති බැවින්,

එකී නීතියේ 20 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ලද නිවාස මා වෙත සතු වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම නිවාසය හෝ නිවාස පිළිබඳ සම්බන්ධතාවයක් දැරූ සියලුම පුද්ගලයන් විසින් එම එක් එක් නිවාසය සඳහා සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසකට මෙම නීතිය යටතේ ගෙවිය යුතු මිළ පිළිබඳව ලිඛිත හිමිකම් පෑම මෙම ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කළ දිනයේ සිට ලිත් මසක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරමි. එම හිමිකම් පෑම් හි මතු සඳහන් කරුණු අන්තර්ගත විය යුතු යි ඃ

(අ) ඔහුගේ/ඇයගේ නම සහ ලිපිනය ඃ
(ආ) එම නිවාසය පිළිබඳ වූ ඔහුගේ/ඇයගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය ඃ
(ඇ) ඔහුගේ/ඇයගේ හිමිකම් පෑමේ විස්තරය ඃ
(ඈ) ඔහු/ඇය එම මිලෙන් හිමිකම් කියන ප්‍රමාණය ඃ

අංක 1644 හා 2010.03.05 දින පළ වූ නිවේදනය මෙයින් සංශෝධනය කරමි.

ජාතික නිවාස කොමසාරිස්.

නිවාස දේපළ උපරිම ශාඛාව,
නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය,
"සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

**උපලේඛනය**

| මගේ යොමු අංකය | ප්‍රකාශකයාගේ නම සහ ලිපිනය | වරිපනම් අංක හා පිහිටීම | දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය බලමණ්ඩලය හා කොට්ඨාස අංකය | මානක සැලැස්ම | කැබලි අංක | පැවරෙන ප්‍රමාණය අ. | රූ. | පර්. |
|---|---|---|---|---|---|---|---|---|
| සීඑච්/ඕ/ 1440 | පී. අයි. ජනරංජනී ප්‍රනාන්දු<br>පී. කාන්ති කුමාරිලතා ප්‍රනාන්දු<br>පී. අසෝක නන්දසිරි<br>පී. කේ. නලීන් කීර්ති ප්‍රනාන්දු<br>අංක 223, දුටුගැමුණු මාවත, පෑලියගොඩ<br><br>නාරංගොඩ දේවගේ හේමාවතී<br>පතින්ද්‍ර දේවගේ සුමිත්<br>නිෂාන් කුමාරසිරි<br>අංක 186/1, දුටුගැමුණු මාවත, පෑලියගොඩ | 250/4, 250/5, 250/6, 250/7 දුටුගැමුණු මාවත, පෑලියගොඩ | ගම්පහ දිස්ත්‍රික්කයේ පෑලියගොඩ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 02 පෑලියගොඩ දුටුගැමුණු මාවත | අංක 576 දරන සීඑච්/ඕ/ 1440 කේ. එම්. සර්දා හේවාමානගේ බලයලත් මිනින්දොරු තැන 2009.08.10 | 2, 3, 4, 5, 6 සහ 7 | | | 10.80 |

06-308

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/38181/සීඩී5/491.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.02.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එල්. එස්. එන්. පී. පෙරේරා විසින් සහතික කරන ලද 1999.10.26 දින හා අංක 210 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මීගොඩ පදිංචි මුදන්නායක මානගේ කාන්ත සිසිර කුමාර මුදන්නායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.22 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැත්තෑහතර දහස් හාරසිය විසි නවයයි ශත විසිතුන (රු. 2,74,429.23)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 210 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය පහයි ශත අසූඅට (රු. 105.88) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගෙහෙනුවල සහ වටරැක පිහිටි කරලුමුහේන, කහටගහවත්ත, අග්ගොනදෙණිය සහ ඕවිටබිම නම් ඉඩමට 1998.07.04 දින බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් මැන සකසන ලද අංක 1794 දරන පිඹුරේ කැබලි අංක 22 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.75ක් බිම් කොටස සමග සියලු දේ.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස 1959.12.31 දින බලයලත් මිනින්දෝරු ඩී. පී. ජයසිංහ විසින් මැන සාදන ලද අංක 1338 දරන පිඹුරේ කැබලි අංක 2 සහිත මාර්ග අයිතිය ද සමග වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/1

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/61061/කිවු2/156.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.01 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. ජේ. ජයවර්ධන විසින් සහතික කරන ලද 1997.05.30 දින හා අංක 14997 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ආඬිඅම්බලම පදිංචි කුරුකුලසූරිය ක්‍රිෂාන්ති රේණුකා ඩයස් සහ කුරුකුලසූරිය ලෝරන්ස් ඩයස් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.02.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැටපන් දහස් අටසිය පනස් තුනයි ශත අනූ හතර (රු. 65,853.94)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 14997 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තිස්හතයි ශත අසූ නවය (රු. 37.89) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු පටුමග, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කලාපය තුළ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කලාපය අලුත්කුරු කෝරළේ උතුරු දූනගහ පත්තුවේ, වඩාත් නිවැරදි ලෙස දාසිය පත්තුවේ ආඬිඅම්බලම පිහිටි වල්පොල එස්ටේට් නමැති ඉඩමට (1996.06.08 දින බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. විරසිංහ නැවත බෙදා වෙන් කරන ලද අංක 1036 දරන පිඹුරේ කැබලි අංක 1 විස්තර පහත වේ) 1996.07.20 දින බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. විරසිංහ විසින් මැන සකසන ලද අංක 1039 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0. පර්. 16.68 හෝ හෙක්. 0.0422ක් වූ බිම් කොටස සමග සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 798/62 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 14997 දරන උකස් බැඳුම්කරයේ අංක 3757 දරන පිඹුරේ කැබලි අංක 3 සහ අංක 1039 දරන පිඹුරේ කැබලි අංක 13, 106, 107 සහ 108 සමග වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-357/2

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීපී/02/4109/එක්ස්2/908.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.01 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ආර්. එම්. එස්. රත්නායක විසින් සහතික කරන ලද 2008.06.24 දින හා අංක 247 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙමංහන්දිය පදිංචි වැවලගේ ඉන්දික ඇන්ටන් ප්‍රියදර්ශන පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.02.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් නවලක්ෂ තිස්පන්දහස් නවසිය හතලිස් හතරයි ශත එක (රු. 9,35,944.01)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 247 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් පන්සිය අසූ නවයයි ශත හැත්තෑ හත (රු. 589.77) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු පටුමග, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, උතුරු අලුත්කුරු “බී” කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු කදිරාන ගමේ පිහිටි වෙස්ටර් සිටන් එස්ටේට් නමැති ඉඩමට 2001.03.15 දින බලයලත් මිනින්දෝරු ඩබ්. එස් . එස්. මෙන්ඩිස් විසින් මැන සකස් කරන ලද අංක 2197 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0. පර්. 12.5ක් වූ බිම් කොටස සමග සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 908/61 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස 1986.11.11 වැනි දින බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් මැන සකසන ලද අංක 2197 දරන පිඹුරේ කැබලි අංක 4 සහ 1 සහිත වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/8

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීපී/02/02320/ජී2/193.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.16 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් චන්දන ගුණතිලක විසින් සහතික කරන ලද 2004.09.01 දින හා අංක 4403 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වේයන්ගොඩ පදිංචි කුඩා දේවතා පේඩිගේ සුගත් චමින්ද පතිරාජ සහ ජයලත් පතිරණගේ දිස්නා කුමාරි ජයවික්‍රම යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.09.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හැටහයදහස් හයසිය හැත්තෑ හයයි ශත හැට නවය (රු. 3,66,676.69)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 4403 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැත්තෑ අටයි ශත තිස් දෙක (රු. 178.32) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහපත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව සහ මද ගොඩපොත උප කාර්යාල සීමාව තුළ ගල්බොඩ පිහිටි දෙමටලන්දවත්ත නොහොත් ගල්බොඩකැලේ නමැති ඉඩමට 1999.09.02 දින බලයලත් මිනින්දෝරු කේ. ටී. පී. ආර්. අභුගම්මන විසින් මැන සාදන ලද අංක 79/1999 දරන පිඹුරේ කැබලි අංක 1ඒ/2සී ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 33.35ක් වූ බිම් කොටස.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 221/94 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස 1977.05.11 දින බලයලත් මිනින්දෝරු ටී. ඒ. රණසිංහ විසින් මැන සකසන ලද අංක 547 දරන පිඹුරේ කැබලි අංක 6 සමග වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/3

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේ/4/6567/කේඑන්1/623.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එච්. වී. ඩී. වික්‍රමරත්න විසින් සහතික කරන ලද 2005.12.05 දින හා අංක 788 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, හුන්නස්ගිරිය පදිංචි සුබසිංහ මුදියන්සේලාගේ පල්ලේ ගෙදර ශාන්ත නොහොත් පල්ලේගෙදර ශාන්ත යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.01.28 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ පනස් දෙදහස් හයසිය දහඅටයි ශත හැටහත (රු. 1,52,618.67)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 788 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හැටදෙකයි ශත හැත්තෑ දෙක (රු. 62.72) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, නව උඩුදුම්බර ගම්පහ බටහිර කෝරළේ, උඩුදුම්බර ප්‍රාදේශීය සභා සීමාව තුළ (බඹරබැද්ද බටහිර) බඹරබැද්ද පිහිටි ලුණුවත්තේ හේන නොහොත් ලුණුගහමුලවත්ත ඉඩමට 1998.08.30 දින බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව විසින් මැන සකසන ලද අංක 2341 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 0ක් වූ බිම් කොටස සමග සියලු දේත් සමග වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 44/211 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේ/18/5280කේවයි3/754, කේයු/18/017/කේයු1/012.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.04.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

කෑගල්ල සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. විජේවර්ධන සහ වී අමරසේකර විසින් සහතික කරන ලද 2002.08.19 සහ 2003.08.22 දින හා අංක 7548, 9284 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කුරුණෑගල පදිංචි මොහොමඩ් හසීම් සිත්ති හනීෂා, අබ්දුල් රසාක් මොහොමඩ් ෂරීන් ෆාතිමා රමීෂා නොහොත් අබ්දුල් රසාක් මොහොමඩ් ෆාරින් ෆාතිමා රම්ෂා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.03.13 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හත්ලක්ෂ එක්දහස් දෙසිය හැත්තෑහයයි ශත දහහතක (රු. 7,01,276.17)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 7548 සහ 9284 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය දහඅටයි ශත බිංදුවයි හත (රු. 318.07) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මැද පාර, මල්කඩුවාව, ගම්මඩුගොල්ල මාවත, අංක 15හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ මල්කඩුවාව පිහිටි හෙරලියාවලවත්ත නමැති ඉඩමට 2002.03.02 දින බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සකසන ලද අංක 20/02 දරන පිඹුරේ කැබලි අංක ඒ ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0. පර්. 15ක් වූ බිම් කොටස සමග සියලු දේත් සමග වේ.

තව ද ඉහත කැබලි අංක ඒ ලෙස දැක්වෙන්නේ 1970.12.05 සහ 1970.12.23 දිනයන්හි බලයලත් මිනින්දෝරු එස්. ටී. පී. සේනාධීර විසින් සාදන ලද අංක 444එෆ් දරන පිඹුරේ කැබලි අංක 22 දරන නැවත මනින ලද බිම් කොටස වේ.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 444එෆ් දරන පිඹුරෙහි සඳහන් පරිදි වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජුනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/5

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/49848/සීඩී9/603.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.21 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ධර්මවර්ධන විසින් සහතික කරන ලද 2006.08.22 දින හා අංක 818 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පිටකෝට්ටේ පදිංචි සේලෝමි තෙරේස් කෲස් ජයසිංහ නොහොත් සේලෝමි තෙරේසා කෲස් සහ ලක්ෂ්මන් මහේෂ් ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තිස් දෙලක්ෂ අසූ දෙදහස් අටසිය හතලිස් හතරයි ශත දහසය (රු. 3,282,844.16)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 818 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එක්දහස් හාරසිය හැටඑකයි ශත පනස් හතර (රු. 1,461.54) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, කටුවාවල, 3 වැනි පටුමග, අංක 21/10ඒහි බලයලත් වෙන්දේසිකාර එෆ්. ආර්. ගල්හේන මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ පිහිටි තිඹිරිගහවත්ත නමැති ඉඩමට 1990.09.26 දින බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් මැන සකසන ලද අංක 3 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0. රූ. 0, පර්. 7.2ක් බිම් කොටස.

මෙය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2008/251 යටතේ ලියාපදිංචි කොට ඇත.

තව ද කොළඹ දිස්ත්‍රික්කයේ, පිටකෝට්ටේ පිහිටි තිඹිරිගහවත්ත නමැති ඉඩමට අංක 3016 දරන පිඹුරේ කැබලි අංක 5 (අඩි 15 පළල මාර්ග අයිතිය) බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0. රූ. 0, පර්. 5.62ක් වූ බිම් කොටස.

මෙය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2008/261 යටතේ ලියාපදිංචි කොට ඇත.

තව ද කොළඹ දිස්ත්‍රික්කයේ, පිටකෝට්ටේ පිහිටි තිඹිරිගහවත්ත නමැති ඉඩමට 1958.03.25 දින බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සකසන ලද අංක 1244 දරන පිඹුරේ කැබලි අංක 5 (අඩි 15

පළල මාර්ග අයිතිය සමග) බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15ක් වූ බිම් කොටස.

මෙය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1637/225 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/6

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 6/40438/එල්6/751.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2010.01.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. බී. පී. වීරසිංහ විසින් සහතික කරන ලද 2000.07.16 දින හා අංක 2187 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කළුතර උතුර පදිංචි හේවාලියනගේ නන්දසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.11.04 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ අනූහතර දහස් හයසිය හැට හතයි ශත හතළිහ (රු. 3,94,667.40)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2187 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය දහසයයි ශත විසිහය (රු. 216.26) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුර මැද පාර, අංක 40හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. සී. එල් ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ උතුර කළුතර බැද්ද කළුතර නගර සභා සීමාව තුළ දේසාස්ට්‍රා කළුතර පිහිටි ඉස්කාගාර පාර, අංක 14ඊ කඩොල්ගහඹිවිලාන ඉඩමට 1999.03.11 දින බලයලත් මිනින්දෝරු ජේ. කොඩිකාරගේ විසින් මැන සකසන ලද අංක 2726 දරන පිඹුරේ කැබලි අංක 1ඒ ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.30ක් වූ බිම් කොටස.

මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 152/130 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/7

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 6/42531/එච්6/630, 6/44738/එච්6/987,
එස්-6/49295/එස්ඕ2/127.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

පානදුර සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. වන්නිගම සහ එස්. වී. පී. කුරේ විසින් සහතික කරන ලද 2001.12.15, 2002.12.04 සහ 2006.04.26 දින හා අංක 1650, 1744 සහ 779 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි සන්ද්‍රා මරක්කල අනිල් රංජිත් නොහොත් සන්දරා මරක්කල අනිල් රංජිත් සහ හේවාවසම් සරුක්කාලිගේ ලලන්ති ධම්මිකා ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.11.06 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ අනූහය දහස් හාරසිය දහතුනයි ශත අසූ හයක් (රු. 1,96,413.86) සහ දෙලක්ෂ තුන්දහස් හාරසිය තිස් එකයි ශත හතළිහක් (රු. 2,03,431.40) සහ පන්ලක්ෂ නවදහස් එකසිය හැත්තෑ නවයයි ශත පනස් නවය (රු. 5,09,179.59)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1650. 1744 සහ 779 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හතයි ශත හැට දෙකක් (රු. 107.62) සහ සියයයි ශත තිස් දෙකක් (රු. 100.32) සහ එකසිය අසූඑකයි ශත තිස්පහ (රු. 181.35)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර,

වලව්වත්ත, ධම්මිකා, අංක 228/ඒ හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ දිබ්බැද්ද පිහිටි දිබ්බැද්දේ වත්ත සහ ගුල්ගහවත්ත නමැති ඉඩමට 2000.09.30 දින බලයලත් මිනින්දෝරු වයි. කේ. කොස්තා විසින් මැන සකසන ලද අංක 2765 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස බෙදා වෙන්කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10ක් වූ බිම් කොටස.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 404/78 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 3765 දරන පිඹුරේ කැබලි අංක 3 සහිත වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/9

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : ජීඑල්/08/00822/ජීඒ1/466, ජීඑල්/08/1670/ජීඒ1/820.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2009.12.21 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. එම්. මෙන්ඩිස් සහ ඒ. ආර්. එම්. ද සිල්වා විසින් සහතික කරන ලද 2004.11.24 සහ 2008.03.03 දින හා අංක 1696 සහ 427 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, අහංගම පදිංචි කලහෙ ලොකුගේ නෙලුම් ප්‍රියන්ත සහ ගුරුවත්ත විදානගේ සුමේදා චතුරානි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.11.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ පනස් තුන්දහස් පන්සිය විස්සයි ශත හැත්තෑතුනක් (රු. 2,53,520.73) සහ අටලක්ෂ දහදහස් පන්සිය හැත්තෑඅටයි ශත හත (රු. 8,10,578.07)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1696 සහ 427 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය දහ අටයි ශත අටක් (රු. 118.08) සහ පන්සිය දහයයි ශත හැත්තෑ අට (රු. 510.78)ක් බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, මාවැල්ල හබරාදූව ප්‍රාදේශීය සභා සීමාව තුළ තිරුවානකැටිය පිහිටි පරගහවත්ත ඉඩමට 1985.03.21 දින බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් මැන සාදන ලද අංක 1515 දරන පිඹුරේ කැබලි අංක එන් ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ 1, පර්. 38.5ක් වූ බිම් කොටස සහ සියලු දේත් සමග වේ.

මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 861/142 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 03 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-357/10

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මීගමුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වෙදනකොන්ද ආරච්චිගේ ඇෂ්ලි සුරංජිත් ප්‍රනාන්දු

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.09.19 දින සහ අංක 1675 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙදනකොන්ද ආරච්චිගේ ඇෂ්ලි සුරංජිත් ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් දසලක්ෂ පනස්අටදහස් පන්සිය තිස්අටයි ශත පනස්අට (රු. 10,58,538.58) ක මුදලක් 2009.12.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 10,58,538.58ක මුදලට 2010.01.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන

ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1675 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කොට්ඨාසයට අයත්) මීගමුව මහ නගර සභා සීමාව තුළ කුරණ 2 වැනි කොට්ඨාසයේ පිහිටි "බෝග්හවත්ස් හෙවත් දංගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක බී. එස්. නානායක්කාර විසින් 1998 මාර්තු මස 03 වැනි දින අංක 1044 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "4" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 1න් ද, නැගෙනහිරට : ලොට් 5න් ද, දකුණට : ලොට් 3න් ද සහ බස්නාහිරට : ලොට් 2න් ද මායිම් වූ ඉඩම ප්‍රකාරව පර්චස් දොළහ (අ. 0, රූ. 0, පර්. 12) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 245/271 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලොට් 5 ට අයත් උකස්කර අංක 1675 හි දෙවන උපලේඛණයෙහි වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-424/9

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - දෙල්ගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගර්දියවසම් වැලිගමගේ චිත්‍රජ සමිතේ වැලිගමගේ වීරක්කොඩිගේ චිලංකා දිල්හානි.

2010.03.01 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.11.03 වැනි දින සහ අංක 24404 සහ බුත්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් පී. කේ. එන්. ජී. විතාන විසින් සහතික කරන ලද්දාවූ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2008.08.18 වැනි දින අංක 10017 (පහත පළවන උපලේඛණයේ විස්තර කර ඇති පරිදි) දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු රුපියල් විසිහයලක්ෂ හැටඅටදහස් හත්සිය තිස්දෙකයි ශත නවය (රු. 26,68,732.09) ක මුදල ගෙවීම පැහැර හැර ඇති බැවින් ද,

බුත්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් පී. කේ. එන්. ජී. විතාන විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2008.08.18 වැනි දින සහ අංක 10015 (පහත දෙවන උපලේඛණයෙහි විස්තර කර ඇති පරිදි) දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු රුපියල් දහඅටලක්ෂ හැටතුන්දහස් හැටපහයි ශත අනූතුන (රු. 18,63,065.93) ක මුදල ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හතලිස් පන්ලක්ෂ තිස්එක්දහස් හත්සිය අනූඅටයි ශත දෙක (රු. 45,31,798.02) ක මුදලක් 2009.10.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 45,31,798.02ක මුදලට 2009.11.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 24404, 10017 සහ 10015 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, වැලිවිට ගමෙහි පිහිටි "ගොරකගහලන්ද කැකුණගහහේන සහ අච්චරියහේන" නමැති ඉඩමට බලයලත් මානක අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් 1995 නොවැම්බර් මස 27 වැනි දින අංක 1448 දරන පිඹුර ප්‍රකාර ලොට් 2 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට උතුරට : ලොට් 3න් ද, නැගෙනහිරට : ලොට් 13 සහ 10න් ද, දකුණට : ලොට් 1න් ද, බස්නාහිරට : ලැවරිස්හාමි හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි සහ අනෙකුත් සියලුම දේත් සමග හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රරු ජී 1441/88හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ලොට් 2 නමැති ඉඩම් කොටස නැවත මැනීමක් පසුව මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, වැලිවිට් ගමෙහි පිහිටි "ගොරකගහලන්ද කැකුණගහහේන සහ අච්චරියහේන" කලින් එල්ස්ලන්ට් එස්ටේට් හෙවත් එල්ස්ටෝන් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක බී. එස්. අලහකෝන් විසින් 2006.06.30 වැනි දින අංක 4887 දරන පිඹුර ප්‍රකාර ලොට් 2 ලෙස ලකුණු කර ලද ඉඩම් කොටසට උතුරට : ලොට් 3න් ද, නැගෙනහිරට : ලොට් 13 සහ 10න් ද, දකුණට : ලොට් 1න් ද, බස්නාහිරට : ලැවරිස්හාමි හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) හෝ හෙක්ටයර් බිංදුවයි දශම දෙකයි පහයි දෙකයි නවය (හෙක්. 0.2529) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි සහ අනෙකුත් සියලුම දේත් සමග වේ.

බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1981 පෙබරවාරි මස 06 වැනි දින අංක එච්/083හි "ලොට් 96" සහ අංක 1448 හි ලොට් 12 සහ 13 දරන පිඹුර ප්‍රකාර වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතීන් ද සමග වේ.

### දෙවැනි උපලේඛනය

පදලංගල ගමෙහි පිහිටි සේරුයාය නමැති ඉඩමට බලයලත් මානක කුසුම් සිරිවර්ධන විසින් 2002 ජනවාරි මස 05 වැනි දින අංක 2/2002

දරන පිඹුර ප්‍රකාර ලොට් 08 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට උතුරට : එම ඉඩමේම ලොට් 7න් ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 21න් ද (අඩි 30ක් පළලැති පාර), දකුණට : ලොට් 9න් ද, බස්නාහිරට : ඉනි වැටෙන් සහ පාරෙන් මායිම් වූ පර්චස් දහතුනයි දශම තුනයි පහ (අ. 0, රූ. 0. පර්. 13.35) ක විශාල ඉඩම වේ.

පදලංගල ගමෙහි පිහිටි සේරුයාය නැමැති ඉඩමට බලයලත් මානක කුසුම් සිරිවර්ධන විසින් 2002 ජනවාරි මස 05 වැනි දින අංක 2/2002 දරන පිඹුර ප්‍රකාර ලොට් 09 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට උතුරට : එම ඉඩමේම ලොට් 8න් ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 21න් ද (අඩි 30ක් පළලැති පාර) දකුණට : ලොට් 10න් ද, බස්නාහිරට : ඉනි වැටෙන් ද සහ පාරෙන් මායිම් වූ පර්චස් දහතුනයි දශම පහයි නවය (අ. 0, රූ. 0, පර්. 13.59) ක විශාල ඉඩම වේ.

පිඹුරු අංක 293/2007ට අයත් ලොට් 21 (අඩි 30ක් පළලැති පාර) රත්නපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 49/242 සහ ජී 49/243 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-424/6

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හම්බන්තොට ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2010.04.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ෆාරුක් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 1997.03.04 වැනි දිනැති අංක 1339, හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. එම්. මහසුම් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 1998.07.16 වැනි දින අංක 2724, හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ෆාරුක් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 1999.09.02 වැනි දින අංක 2027, අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2002.04.19 වැනි දින අංක 5297 සහ 2006.01.18 වැනි දින අංක 8132 (මෙහි පහත පළවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ) සහ අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2002.04.19 වැනි දින අංක 5298 සහ 2006.06.30 දින අංක 8511 (මෙහි පහත දෙවැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ) සහ අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2006.11.24 වැනි දින අංක 8851 (මෙහි පහත තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ) දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුදර්මන් රත්නසිරි හේවා අබේපිටිය යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දාසය ලක්ෂ විසිඑක්දහස් හත්සිය පනස්එකයි ශත තුන (රු. 16,21,751.03) ක මුදලක් 2009.07.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 16,21,751.03ක මුදලට 2009.08.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1339, 2724, 2027, 5297, 8132, 5298, 8511 සහ 8851 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට නගර සභා සීමාව තුළ බ්‍රේබෲක් වීදියේ, කලින් වරිපනම් අංක 109 සහ දැන් වරිපනම් අංක 33 දරන ඉඩමට බලයලත් මානක ඩබ්. ඩී. ගමගේ විසින් මැන සාදන ලද 1992 ඔක්තෝබර් මස 12 වැනි දින සහ අංක 272ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් 2 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 272ඒ ට අයත් ලොට් 1න් ද, නැගෙනහිරට : බ්‍රේබෲක් වීදියෙන් ද, දකුණට : පිඹුරු අංක 272ඒ ට අයත් ලොට් 3 සහ 4 න් ද, බස්නාහිරට : පිඹුරු අංක 272ඒ ට අයත් ලොට් 5න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 45/144 වෙළුමේ සහ පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට පිහිටි බ්‍රේබෲක් වීදියේ, වරිපනම් අංක 33 දරන ඉඩමට බලයලත් මානක අයි. කොටඹගේ විසින් මැන සාදන ලද 2002 මාර්තු මස 07 වැනි දින සහ අංක 2114 දරන පිඹුර ප්‍රකාර ලොට් $1^2$ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන, උතුරට : එම ඉඩමේම ඉතිරි කොටසින් ද (වරිපනම් අංක 33) නැගෙනහිරට : බ්‍රේබෲක් වීදියෙන් ද, දකුණට : පිඹුරු අංක 2114ට අයත් ලොට් $1^1$න් ද, බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටසින් ද, (වරිපනම් අංක 33) මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම තුළ ඇති ගහකොළ සහ අනෙකුත් සියලුම දේත් සමග වේ.

### තුන්වන උපලේඛනය

පහත සඳහන් සියලු හා එක් එක් වංචල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වලින් එනම්,

| *විස්තරය* | *වර්ගය* | *මොඩල් අංකය* | *අනුක්‍රමික අංකය* |
|---|---|---|---|
| 500 එම්ඒ/125 කේකේවී<br>එක්ස් රේ සිස්ටම්<br>3 ෆේස් ෆුල් වේව්<br>රෙක්ටිෆිකේෂන්<br>එක්ස් රේ ජෙනරේටරය | ෂයිමඩ්සු<br>(ජපානය) | | |

යන ඒවායින් සමන්විත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ඒවාට අනුබද්ධ සියලු උපාංග ද සමග (මෙහි මින් ඉදිරියට බන්ධනදායීගේ චංචල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ යනුවෙන් එක්ව සඳහන් කරනු ලබන) දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අංක 37 දරන පරිශ්‍රය තුළ හා මත සහ ඉහත කී දිස්ත්‍රික්කයේ බන්ධනදායී විසින් දැනට හෝ මතු යම් අවස්ථාවක හෝ කලින් කල බන්ධනදායීගේ චංචල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ තබා හෝ දමා තිබෙන වෙනත් යම් පරිශ්‍ර තුළ තබා හෝ දමා තිබෙන සියලු හා එක් එක් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ හෝ මෙය බලාත්මකව පවත්නා කාලය තුළ බන්ධනදායිගේ චංචල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ හා බඩු බාහිරාදිය ගෙන එනු ලබන හෝ දමා තිබෙන වෙනත් යම් පරිශ්‍ර තුළ සහ බන්ධනදායී විසින් එම චංචල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඉවත් කරගෙන ගොස් තබා තිබිය හැකි වෙනත් යම් ස්ථානයක හෝ ස්ථානවල ඇති සියලු හා එක් එක් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-424/7

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කන්තලේ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දේවතන්ත්‍රි ආරච්චිලාගේ රංගජීව උපනන්ද, වික්‍රමසිංහ රත්නායක දුග්ගන්නා මුදින්සේලාගේ අචලා වසන්ති වික්‍රමසිංහ සහ දන්දූව හේවාවිතාරනගේ මානෙල්.

2010.04.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2009.03.20 වැනි දිනැති සහ අංක 7290 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දේවතන්ත්‍රි ආරච්චිලාගේ රංගජීව උපනන්ද වික්‍රමසිංහ රත්නායක දුග්ගන්නා මුදින්සේලාගේ අචලා වසන්ති වික්‍රමසිංහ සහ දන්දූව හේවාවිතාරනගේ මානෙල් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහත්ලක්ෂ දහහතරදහස් පන්සිය විසිඑකයි ශත දොළහ (රු. 27,14,521.12) ක මුදලක් 2009.10.21 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 27,14,521.12ක මුදලට 2009.10.22 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 7290 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරන මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, එගොඩපොත උප කාර්යාල සීමාවේ, මාදුවේගෙදර පිහිටි "පොකුණුවලවත්ත නොහොත් රන්පොකුණවත්ත" නමැති ඉඩමට බලයලත් මානකවරුන් වන ඒ. ඒ. රූපසිංහ ආනන්ද, කේ. ඩී. එෆ්. ආර්. පෙරේරා සහ ආර්. තම්බුගල විසින් පිළියෙල කරන ලද 1983.08.01 දිනැති අංක ගම් 127 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 502 ඉඩම් කොටස වන උතුරට : ලොට් අංක 512 න් ද, නැගෙනහිරට : ලොට් අංක 503න් ද, දකුණට : ලොට් අංක 490 සහ 491 න් ද සහ බස්නාහිරට : ලොට් 501 න් ද මායිම් වූ එකී ගම් 127 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයයි දශම අටයි හතර (අ. රූ. 0, පර්. 10.84) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වන මෙය ගම්පහ ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ එෆ් 292/62 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ඒ. සී. එල්. අතුකෝරල විසින් 2008.12.10 වැනි දින මැන සාදන පිඹුර අංක 3689 දරන ඉහත ඉඩම නැවත මැනීමකට අනුව පහත පරිදි වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, උඩගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, එගොඩපොත උපකාර්යාල සීමාවේ, මාදුවේගෙදර, "පොකුණුවලවත්ත නොහොත් රන්පොකුණුවත්ත" නමැති ඉඩමේ ලොට් අංක 502 නැමැති ඉඩම් කොටස වන උතුරට : ගම්147හි ලොට් අංක 512 (පාර) න් ද, නැගෙනහිරට : ගම් 147හි ලොට් අංක 503න් ද, දකුණට : ගම් 147හි ලොට් අංක 490 සහ 491 න් ද, සහ බස්නාහිරට : ගම් 147හි ලොට් 501න් ද මායිම් වූ එකී ගම් 127 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයයි දශම අටයි හත (අ. 0, රූ. 0, පර්. 10.84)ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

ගම් 147 දරන පිඹුරේ සඳහන් මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-424/8

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බම්බලපිටිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

චක්‍රවර්තිගේ ක්‍රිස්කා චාන්දනී ප්‍රනාන්දු සහ චක්‍රවර්තිගේ ප්‍රවීන් සොමේල් ප්‍රනාන්දු.

2010.04.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2006.02.23 වැනි දිනැති සහ අංක 1741 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම චක්‍රවර්තිගේ ක්‍රිස්කා චාන්දනී ප්‍රනාන්දු සහ චක්‍රවර්තිගේ ප්‍රවීන් සොමේලි ප්‍රනාන්දු යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ අනූහත්දහස් පන්සිය තිස්නමයයි ශත අසූතුන (රු. 6,97,539.83) ක මුදලක් 2010.02.08 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 6,97,539.83ක මුදලට 2010.02.09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1741 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ, වැලිසර උප කාර්යාලය තුළ වැලිසර පිහිටි "මගුල්පොකුණ" නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් පිළියෙල කරන ලද 1987.05.05 දිනැති අංක 9653 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 9ඒ නමැති ඉඩම් කොටස වන උතුරට : ලොට් අංක 8 සහ පිඹුරු අංක 830හි ලොට් අංක 10 වෙන් කර ඇති සහ එකී අංක 9653 පිඹුරේ ලොට් 9බී වලින් ද, (අඩි 20 පළල පාර) න්, නැගෙනහිරට : පිඹුරු අංක 9653හි ලොට් අංක 9බී වලින් ද, දකුණට : පිඹුරු අංක 9653හි ලොට් අංක 9බී වලින් ද, සහ බස්නාහිරට : සී. එම්. විජේසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 9653 හි දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩම වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 433/110 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ලොට් අංක 9ඒ දරන ඉඩම් කොටස මෑතකදී කරන ලද මැණුමකට අනුව මෙසේ විස්තර වේ.

ඉහත කී වැලිසර පිහිටි මගුල් පොකුණ පාරේ, වරිපනම් අංක 79/18 දරන "මගුල්පොකුණ" නමැති ඉඩමට බලයලත් මානක එස්. ජී. ගුණතිලක විසින් පිළියෙල කරන ලද 2005.05.18 දිනැති අංක 3900 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 9ඒ2 නමැති ඉඩම් කොටස වන උතුරට : බලයලත් මානක කේ. ඒ. පී. කේ. කස්තුරිරත්න විසින් පිළියෙල කරන ලද 1980.07.14 දිනැති අංක 830 දරන පිඹුරේ ලොට් 8 සහ ලොට් 10 (වෙන්කර ඇති අඩි 20 පළල පාර)න් ද, නැගෙනහිරට : පුද්ගලික පාරෙන් ද, දකුණට : බලයලත් මානක ඒ. ඩී. ජේ. වී. පෙරේරා විසින් 1987.05.05 වැනි දින මැන සාදන ලද අංක 9653 පිඹුරේ ලොට් අංක 9බී වලින් ද, සහ බස්නාහිරට : සී. එම්. විජේසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 3900 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම නමය (අ. 0. රූ. 0, පර්. 8.9) ක් විශාල ඉඩම වේ.

බලයලත් මානක කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් පිළියෙල කරන ලද 1980.07.14 දිනැති අංක 830 දරන පිඹුරේ ලොට් අංක 10 (වෙන්කර ඇති අඩි 10ක් පළල පාර) මතින් මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මාණ්ඩලයේ ලේකම්.

06-424/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - හලාවත ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ණකුලසූරිය අමාලි ශිවන්ති ප්‍රනාන්දු.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්ටෝ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2007.05.24 දින සහ අංක 5197 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, වර්ණකුලසූරිය අමාලි ශිවන්ති ප්‍රනාන්දු යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පහලොස්ලක්ෂ හැටපන්දහස් අටසිය හතලිහයයි ශත විසිහතර (රු. 15,65,840.24) ක මුදලක් 2010.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රු. 15,65,840.24ක මුදලට 2010.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5197 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්යේ, මාරවිල, දකුණු පිටිගල් කෝරළය තුළ ලියාපදිංචි යටකලං පත්තුවේ, ඉහල හතිනියහි පිහිටි "කජුගහවත්ත එහෙටුගහවත්ත සහ සියඹලාගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. ප්‍රනාන්දු විසින් 1989 ජූලි මස 14 වැනි දින අංක 8017 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 7" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : වෙන් කරන ලද පාරකින් ද, නැගෙනහිරට : පිඹුරට අයත් ලොට් 6න් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : පිඹුරට අයත් ලොට් 8න් ද මායිම් වූ ඉඩම ප්‍රකාරව පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක විශාල ඉඩම තුළ ඇති සියලුම දේත් සමග මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 9/226 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-424/2

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කුරුඳුවත්ත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වල්පොලගේ සේන.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.08.24 දිනැති සහ අංක 2885 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, වල්පොලගේ සේන යන අය ණයකරු හැටියට ද පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ රුපියල් එකසිය හතලිස්හයලක්ෂ අටදහස් නමසිය විසිහතරයි ශත හතලිස්පහක රු. 14,68,924.45) මුදලක් 2009.09.09 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 14,68,924.45ක මුදලට 2009.09.10 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2885 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවේ හිරිපිටියේ "ගලබොඩවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඒ. හෙට්ටිගේ විසින් ලියා සහතික කරන ලද 1993.01.17 දිනැති අංක 1463 පිඹුරේ ලොට් අංක 3 නමැති ඉඩමට මායිම්, ඊසානදිගට : බලයලත් මානක පී. එච්. පෙරේරා විසින් මැන සාදන ලද පිඹුරු අංක 142හි ලොට් අංක 1න් ද, ගිණිකොණට : ලොට් අංක 4න් ද, නිරිතදිගට : ලොට් අංක 6 සහ 2න් ද වයඹට : පාසල් භූමියෙන් ද මායිම් වූ පර්චස් විස්සයි දශම බින්දුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 20.08) විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළු දේත් සමග වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1537/119 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-424/5

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - ත්‍රිකුණාමලය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මොහොමඩ් ෂා හනීෆා මොහොමඩ් ජවුෆර් හසන්.

2010.03.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. තිරුකුමාරනාතන් විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.06.23, 2008.07.28 දිනැති සහ පිළිවෙලින් අංක 3354 සහ 3370 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් ෂා හනීෆා මොහොමඩ් ජවුෆර් හසන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිතුන්ලක්ෂ දහනමදහස් අටසිය තිස්නමයයි ශත අනූවක (රු. 23,19,839.90) මුදලක් 2009.12.14 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 23,19,839.90ක මුදලට 2009.12.15 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3354 සහ 3370 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගරයේ සහ කොටුවේ, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ත්‍රිකුණාමලය නාගරික සභා සීමාවේ, "බසාර්" කොට්ඨාස අංක 08 (ත්‍රිකුණාමලය බලයලත් මානක ඒ. ලෝගනාතන් විසින් මැන සාදන ලද 2007.05.20 දිනැති අංක 631 පිඹුරේ ලොට් අංක 1ඒ සහ 2ඒ) පාසල් පටුමගේ (දැන් "කොත්ති ලේන් ") වරිපනම් අංක 40/8හි "කංගසිංහම් තාරායි " නමැති ඉඩමට බලයලත් මානක ඒ. ලෝගනාතන් විසින් ලියා සහතික කරන ලද 2007.09.06 දිනැති අංක 631 දරන පිඹුරේ ලොට් අංක ඒ ඉඩමට මායිම්, උතුරට : ත්‍රිකුණාමලය, ලේවැල්ලේ, බලයලත් මානක ඒ. ලෝගනාදන් විසින් මැන සාදන ලද 2007.05.20 දිනැති අංක 631 පිඹුරේ ලොට් අංක 2සී, 2ඩී සහ 1සී වලින් ද, නැගෙනහිරට : 2007.05.20 දිනැති අංක 631 පිඹුරේ ලොට් අංක 1සී සහ 1බී වලින් ද, දකුණට : 2007.05.20 දිනැති අංක 631 පිඹුරේ ලොට් අංක 1බී. එස්. පුලෙන්තිරන්ට අයිති ඉඩමෙන්, පටුමගෙන් සහ අංක 631 පිඹුරේ ලොට් අංක 2බී වලින් ද, සහ බස්නාහිරට : 2007.05.20 දිනැති අංක 631 පිඹුරේ ලොට් අංක 2සී (පිවිසුම්) ලොට් අංක 2බී න් ද මායිම් වූ පර්චස් දොළහයි දශම එකයි හතක් (අ. 0, රූ. 0, පර්. 12.17) විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-424/11

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - ත්‍රිකුණාමලය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සරවනබාවා නොහොත් ශ්‍රී සරවන්බාවා ආනන්දජෝති ජයරාණි ආනන්දජෝති

2010.03.01 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. තිරුකුමාරනාතන් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2004.11.02 දිනැති සහ අංක 2452 දරන බැඳුම්කරය යටතේ (පහත උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් හයලක්ෂ පනස්හතරදහස් අටසිය තිස්අටයි ශත අනූහතක (රු. 6,54,838.97) මුදලක් 2009.11.10 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ගෙවීම සරවනබාවා නොහොත් ශ්‍රී සරවන්බාවා ආනන්දජෝති ජයරාණි ආනන්දජෝති යන අය ණයකරු හැටියට සහ ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. තිරුකුමාරනාතන් විසින් සහතික කරන ලදදාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2007.08.30 දිනැති සහ අංක 553 දරන බැඳුම්කරය යටතේ (පහත උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් දොලොස් ලක්ෂ අසූදහස් තුන්සිය විසිඅටයි ශත අනූවක (රු. 12,80,328.90) මුදලක් 2009.11.10 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට ගෙවීම සරවනබාවා නොහොත් ශ්‍රී සරවන්බාවා ආනන්දජෝති ජයරාණි ආනන්දජෝති යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහනමලක්ෂ තිස්පන්දහස් එකසිය හැටහතයි ශත අසූහතක (රු. 19,35,167.87) මුළු මුදලක් 2009.11.11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2452 සහ 553 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගරයේ සහ කොටුවේ, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය නාගරික සීමාවේ, කොට්ඨාස අංක 01 වරිපනම් අංක 195 දැන් ජෝර්ජ් වීදියේ, අංක 01, ගහකොළ, ලිඳ කාමර හතරක් සහිත නිවසේ උතුරට : එම්. වී. බෙරමුත්ත අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : එම්. එස් කන්දයියාට අයිති ඉඩමෙන් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ පර්චස් දාසයයි දශම හතයි එකක් (අ. 0, රූ. 0. පර්. 16.71) විශාල ඉඩම වේ.

ඉහත ඉඩම නැවත මැනීමකට අනුව නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගරයේ සහ කොටුවේ, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය නාගරික සීමාවේ, ''පෙරියාකඩ්'' කොට්ඨාස අංක 02, ජෝර්ජ් වීදියේ වරිපනම් අංක 195 සහ 196 (පරන) 1 සහ 1ඒ (අලුත්) දරන ඉඩමට බලයලත් මානක පී. මහේන්ද්‍රනාතන් විසින් මැන සාදන ලද 2004.01.10 දිනැති අංක 3 දරන පිඹුරේ ලොට් අංක ඒ නමැති ඉඩමට මායිම්, උතුරට : සින්නතුරෙයි මංගලේෂ්වරිට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : එම් එස්. කන්දයියාට අයිති ඉඩමෙන් ද, දකුණට : ජෝර්ජ් පටුමගෙන් ද සහ බස්නාහිරට : ජෝර්ජ් වීදියෙන් සහ බාරති පාරෙන් ද මායිම් වූ පර්චස් දහනමයයි දශම හතරයි තුන (අ. 0, රූ. 0, පර්. 19.43) ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-424/12

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පිළියන්දල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රුෂාන් චින්තක ජයවර්ධන.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2008.05.13 වැනි දින සහ අංක 3177 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රුෂාන් චින්තක ජයවර්ධන යන අය ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ තිස්හත්දහස් එකසිය පනස්එකයි ශත තිස්නමය (රු. 20,37,151.39) ක මුදලක් 2010.02.01 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 20,37,151.39ක මුදලට 2010.02.02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3177 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාවේ, බොරලැස්ගමුව, වත්තේගෙදර

වරිපනම් අංක 97/30 "කජුගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඒ. රූබසිංහ විසින් ලියා සහතික කරන ලද 1961.08.14 දිනැති අංක 1108 පිඹුරේ ලොට් අංක 10සී නමැති ඉඩමට මායිම්, උතුරට : ලොට් අංක 10බී වලින් ද, නැගෙනහිරට : ලොට් අංක 14න් ද, දකුණට : ලොට් අංක 9න් සහ බස්නාහිරට : ලොට් අංක 10ඒ න් ද මායිම් වූ පර්චස් දොළහයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 12.8) විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

ඉහත කී ඉඩම මෑතක දී බලයලත් මානක එච්. කේ. මාහින්ද විසින් මැන සාදන ලද 2000.11.23 දිනැති අංක 936 දරන පිඹුර පහත පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාවේ, බොරලැස්ගමුව, වත්තේගෙදර වරිපනම් අංක 97/30 "කජුගහවත්ත" නමැති ඉඩමේ පිඹුරු අංක 936හි ලොට් අංක 1ට මායිම්, උතුරට : ග්‍රාමෝදය මාවතේ, වරිපනම් අංක 97/31න් ද, නැගෙනහිරට : ග්‍රාමෝදය මාවතෙන් ද, දකුණට : පාර (පුද්ගලික) සහ බස්නාහිරට : ග්‍රාමෝදය මාවතේ, වරිපනම් අංක 97/26න් ද මායිම් වූ පර්චස් දොළහයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.80) විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

ඉහත කී අංක 3177 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වැඩිදුරටත් පෙන්නුම් කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-424/10

---

## මහජන බැංකුව - ඒකාබද්ධ බැංකු අංශය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.11.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ජී. ඒකනායක විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2005.10.05 දිනැති අංක 4804 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. ඩී. ද සිල්වා සිරිසේන විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2007.11.15 දිනැති අංක 78 දරන උකස්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 120හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සීමිත වගකීම් සහිත සමාගමක් වන පී. වී. 5757 දරන සීමාසහිත ජේ. එන්. ඉන්ටීරියර්ස් (පෞද්ගලික) සමාගම විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය මත රුපියල් හත්ලක්ෂ පනස්එක්දහස් එකසිය හැත්තෑවයි ශත විස්සක (රු. 7,51,170.20) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද, 2009.10.07 වැනි දින සිට වර්ෂයකට සියයට විසිඑකයි දශම පහ (21.5%) බැගින් රුපියල් හයලක්ෂ අසූතුන්දහස් එකසිය හැටදෙකයි ශත හැත්තෑහතක (රු. 6,83,162.77) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් හත්ලක්ෂ පනස්එක්දහස් එකසිය හැත්තෑවයි ශත විස්සක (රු. 7,51,170.20) මුදල අයකරගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර එම්. එම්. ඊ. එස්. රාමනායක විසින් එකී අංක 4804 සහ 78 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ පිටිගල කෝරලේ කම්මල්පත්තුවේ වෙන්නප්පුවේ පිහිටා ඇති අඹගහවත්ත නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ඩබ්ලිව්. වීරක්කොඩි විසින් 2000.10.14 දින මැන සාදන ලද අංක 743ඒ දරන පිඹුරේ ලොට් 1 හි උපබෙදීමක් වශයෙන් පවතින) බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් 2004.08.26 දින මැන සාදන ලද අංක 9388ඒ දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් මැන සාදන ලද අංක 1299 දරන පිඹුරේ ලොට් 2 ද, නැගෙනහිරට : ඉහත කී අංක 9388ඒ දරන පිඹුරේ ලොට් 2 ද, දකුණට : අංක 9388ඒ දරන පිඹුරේ ලොට් 3 සහ බටහිරට : ප්‍රාදේශීය සභා පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 9388ඒ දරන පිඹුර ප්‍රකාර පර්චස් විසි අටක් (අ. 0, රූ. 0, පර්. 28) හෝ හෙක්ටයාර් 0.0708 විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැව්ලි, ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 96/287 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි අයකිරීම්,
ඒකාබද්ධ බැංකු අංශය.

මහජන බැංකුව,
ඒකාබද්ධ බැංකු අංශය,
අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

06-349

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මෙට්‍රෝ ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : දොඩන්වලගේ නිශාන් පෙරේරා

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :-

එනම්, දොඩන්වලගේ නිශාන් පෙරේරා විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බෑන්ක් ලිමිටඩ්

යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට දෙකම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 1101 සහ 2001 නොවැම්බර් 15 සහ අංක 1120 සහ 2001 දෙසැම්බර් 24 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් 2010.02.02 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් නම ලක්ෂ හැට හත් දහස් හයසිය හැටයි ශත හැට දෙක (රු. 9,67,660.62) ක මුදල සහ 2010.01.23 දින සිට රුපියල් හත් ලක්ෂ හැත්තෑ හතර දහස් තුන්සිය නමයයි ශත අනූ අට (රු. 7,74,309.98) ක මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොලිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව තිබෙන හෙයින් ද, පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

එකී අංක 1101 සහ 1120 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් නම ලක්ෂ හැට හත් දහස් හය සිය හැටයි ශත හැට දෙක (රු. 9,67,660.62) ක මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි පොලිය ද ගාස්තු ද, අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, බැංකුව වෙත උකස්කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ බටකැත්තර පිහිටි කහටගහලන්ද නැමැති ඉඩමට බලයලත් මානක ඊ. ඩී. ජී. කේ. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 2938 සහ 1991.05.13 දිනැති සැලැස්මේ ලොට් 41 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති, උතුරට : එකී ඉඩමේ ලොට් 46 සහ 42 (අඩි 20ක පාරක් සඳහා වෙන් කිරීම) නැගෙනහිරට : එකී ඉඩමේ ලොට් 40, දකුණට: එකී ඉඩමේ ලොට් 40 (එච්. පී. ටී. සමාගමේ ඉඩම) සහ බස්නාහිරට : එල්. දොන් විලියම්ගේ උරුමක්කරුවන් සහ වෙනත් අය හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම පහ (අ. 0, රූඩ්. 0, පර්. 15.5) ක් විශාල ඉඩම සහ එහි තුළ ගහකොළ පළතුරු වැවිලි ආදී සියලු දේ වේ. ගල්කිස්ස (දැනට දෙල්කඳ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1936/235 හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 2938 සැලැස්මේ ලොට් 42, 43 සහ 1990 ජූනි 20 දිනැති අංක 1844 සැලැස්මේ ලොට් එක්ස් මත මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

මනෝනිත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම්.

06-451/2

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හලාවත ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

බුලත්සිංහලගේ සෙනරත් මධුරංග පෙරේරා.

2010.03.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්ටෝ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද, 2006.04.25 දිනැති සහ අංක 4772 දරන බැඳුම්කරය යටතේ (පහත පළමුව සහ දෙවනුව පළවන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් එක්ලක්ෂ විසිහයදහස් තුන්සිය අනූපහයි ශත දොළහ (රු. 1,26,395.12) ක මුදලක් 2009.11.30 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට ගෙවීම සහ

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. එස්. මැදගොඩ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂන්ල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද, 2007.09.29 දිනැති අංක 8119 දරන බැඳුම්කරය යටතේ (පහත පළමුව දෙවන උපලේඛනයේ සඳහන් පරිදි) සහ අංක 8120 දරන බැඳුම්කරය යටතේ (පහත දෙවනුව දෙවන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් දෙලක්ෂ විසිඑක්දහස් එකසිය පනස්දෙකයි ශත හැටදෙක (රු. 2,21,152.62) ක මුදලක් 2009.11.30 වැනි දින විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට ගෙවීම එකී 8119 සහ 8120 උකස්කර යටතේ සහ

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. එස්. මැදගොඩ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නිමට ලියන ලද්දාවූ ද, 2008.08.25 දිනැති අංක 8762 දරන බැඳුම්කරය යටතේ (පහත තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් හාරලක්ෂ හතලිස් අටදහස් පන්සිය හතලිස් හයයි ශත තිහ (රු. 4,48,546.30) ක මුදලක් 2009.11.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට ගෙවීම සහ

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. එස්. මැදගොඩ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද, 2005.03.03 දිනැති අංක 6332 ද, 2005.11.30 සහ අංක 6827 සහ 2007.05.30 දිනැති සහ අංක 7896 දරන බැඳුම්කර යටතේ (පහත හතරවන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් එක්ලක්ෂ හතලිස්නමදහස් අටසිය හැත්තෑඑකයි ශත තිහ (රු. 1,49,871.30) ක මුදලක් 2009.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට ගෙවීම සහ

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. එස්. මැදගොඩ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2008.09.25 දිනැති අංක 8761 දරන බැඳුම්කර යටතේ (පහත පස්වන උපලේඛනයේ සඳහන් පරිදි) අයවිය යුතු රුපියල් හත්ලක්ෂ අනූහත්දහස් පන්සිය හතලිස්හතයි ශත පනහ (රු. 7,97,547.50) ක මුදලක් 2009.11.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී ට

ගෙවීම සහ බුලත්සිංහලගේ සෙනරත් මධුරංග පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහහත්ලක්ෂ හතලිස්තුන්දහස් පන්සිය දොලහයි ශත අසූහතර (රු. 17,43,512.84) ක මුළු මුදලක් 2009.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4772, 8119, 8120, 8762, 6332, 7896 සහ 8761 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවන උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු පිටිගල කෝරළයේ, මුන්නේෂ්වරන් පත්තුවේ, තිත්තකඩේ ගමේ "තිත්තකඩේ කැලේ " නමැති ඉඩමට බලයලත් මානක පී. ඩී. ජී. වීරසිංහ විසින් ලියා සහතික කරන ලද 1999.11.02 දිනැති අංක 5030 පිඹුරේ ලොට් අංක 13ට මායිම්, උතුරට : ඒ. එස්. එෆ්. විජේගුණරත්ට අයිති දිවුලෙන ස්ටේට් වලින් ද, නැගෙනහිරට : අංක 5030 පිඹුරේ ලොට් අංක 14න් ද, දකුණට : පිඹුරු අංක 5030හි ලොට් අංක 77 ලෙස ලකුණු කළ පාර සහ ලොට් අංක 12න් ද සහ බස්නාහිරට : අංක 5030 දරන පිඹුරේ ලොට් අංක 7න් ද මායිම් වූ පර්චස් විසිඑකයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 21.3) ක් විශාල ඉඩම වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 158/105 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී තිත්තකඩේ ගමේ "තිත්තකඩේ කැලේ " නමැති ඉඩමට ඉහත කී අංක 5030 පිඹුරේ ලොට් අංක 15ට මායිම්, උතුරට : පිඹුරු අංක 5030 හි ලොට් අංක 14න් ද, නැගෙනහිරට : අංක 5030 පිඹුරේ ලෙට් අංක 76 ලෙස ලකුණු කරන ලද පාරෙන් ද, දකුණට : පිඹුරු අංක 5030හි ලොට් අංක 16 සහ 17න් ද සහ බස්නාහිරට : ලොට් අංක 11 සහ 12න් ද මායිම් වූ පර්චස් විසිඑකයි දශම අට (අ. 0, රූ. 0, පර්. 21.8)ක් විශාල ඉඩම සහ ගහකොළ සහ සියළුදේත් සමග මාර්ග අයිතිය ද සමග වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 158/106 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් අටලක්ෂ හැත්තෑනවදහස් හාරසිය හැත්තෑනමයයි ශත හැත්තෑතුන (රු. 48,79,479.73) ක මුදලක් 2009.08.31 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී.ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 48,79,479.73ක මුදලට 2009.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 13162 සහ 13163 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, තිසාවැව කෝරළයේ, මාපිටිගෙදර ගමෙහි පිහිටි ''බොක්කගල්ගොඩහේන'' නමැති ඉඩමට සර්වෙයර් ජනරාල් විසින් අංක 431029 දරන පිඹුර ප්‍රකාර ලොට් 27එච් ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට උතුරට : ලොට් 27එෆ් සහ 27ජී වලින් ද, නැගෙනහිරට : ලොට් 29න් ද, දකුණට : ලොට් 27අයි වලින් ද, බස්නාහිරට : වෙන් කරන ලද පාරකින් ද මායිම් වූ අක්කර එකයි පර්චස් හත (අ. 1, රූ. 0, පර්. 7) විශාල ඉඩම තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1173/197 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මාපිටිගෙදර ගමෙහි පිහිටි ''බොක්කගල්ගොඩහේන'' නමැති ඉඩමට බලයලත් මානක ඒ. ජේ. සෙනෙවිරත්න විසින් 2005.10.19 දින නැවත මැන සෑදූ අංක 05/69ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් 01 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට, උතුරට : එෆ්. වී. පී. 2319හි ලොට් 27එෆ් සහ 27ජී වලින් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : එෆ්. වී. පී. 2319හි ලොට් 27අයි වලින් ද, බස්නාහිරට : ලොට් 27 සහ 42න් ද (වෙන් කරන ලද පාරකින් ද) මායිම් වූ රූඩ් තුනයි, පර්චස් තිස්හය (අ. 0, රූ. 3, පර්. 36)ක විශාල ඉඩම වේ.

2. බස්නාහිර පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, තිසාවැව කෝරළයේ, දිවුල්කඩවර ගමෙහි පිහිටි ''වානගාව ගොඩැල්ල හේන'' නමැති ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් අංක ටී 20389 දරන පිඹුර ප්‍රකාර ලොට් 41එෆ් ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට, උතුරට : ලොට් 41ඊ වලින් ද, නැගෙනහිරට : මාපිටිගෙදර සීමාවෙන් ද, දකුණට : කොස්දෙනිය සීමාවෙන් ද සහ බස්නාහිරට : ලොට් 42න් ද සහ දිවුල්කඩවර ඇලට වෙන් කරන ලද කොටසින් ද, මායිම් වූ අක්කර හතරයි, පර්චස් එකොළහක් (අ. 4, රූ. 0, පර්. 11) විශාල ඉඩම තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1173/196 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

දිවුල්කඩවර ගමෙහි පිහිටි ''වානගාව ගොඩනැල්ල හේන'' නමැති ඉඩමට බලයලත් මානක ඒ. ජේ. සෙනෙවිරත්න විසින් 2005.08.19 වැනි දින අංක 05/70 දරන පිඹුර ප්‍රකාර ලොට් 01 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට, උතුරට : එෆ්. වී. පී. 2318හි ලොට් 41ඊ වලින් ද, නැගෙනහිරට : මාපිටිගෙදර ගම් සීමාවෙන් ද සහ වෙන් කරන ලද පාරකින් ද, දකුණට : කොස්දෙනිය ගම් සීමාවෙන් ද (එෆ්. වී. පී. 2328) සහ බස්නාහිරට : එෆ්. වී. පී. 2318 හි ලොට් 42 න් ද සහ ඇලෙන් ද මායිම් වූ අක්කර හතරයි, පර්චස් එකොළහයි දශම බිංදුව (අ. 4, රූ. 0, පර්. 11)ක විශාල ඉඩම වේ.

### දෙවැනි උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, ගිරාතලාන කෝරළයේ, ගිරාතලන ගමෙහි පිහිටි ''අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 10 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 9 න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : 3265 දරන එම පිඹුරට අයත් ලොට් 11න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.40) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/14 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

2. එකී ගිරාතලාන ගමෙහි පිහිටි ''අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 දින සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 11 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 10න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : 3265 දරන එම පිඹුරට අයත් ලොට් 12න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.40) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/15 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

3. එකී ගිරාතලන ගමෙහි පිහිටි ''අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 දින සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 14 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3365ට අයත් ලොට් 12න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13 න් ද, දකුණට : 3265 දරන එම පිඹුරට අයත් ලොට් 15න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.40)ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/16 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

4. එකී ගිරාතලන ගමෙහි පිහිටි ''අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 වැනි සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 15 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 14න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : 3265 දරන එම පිඹුරට අයත් ලොට් 16න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම හතරයි බිංදුව (අ. 0. රූ. 0, පර්. 15.40) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/17 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

5. එකී ගිරාතලන ගමෙහි පිහිටි ''අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 16 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 15න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : 3265 දරන එම පිඹුරට අයත් ලොට් 17න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.40) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/18 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

6. එකී ගිරාතලන ගමෙහි පිහිටි ''අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය'' නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 17 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 16න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : 3265 දරන එම පිඹුරට අයත් ලොට් 18න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.40) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියලුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/19 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

7. එකී ගිරාතලන ගමෙහි පිහිටි අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 18 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 17න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : 3265 දරන එම පිඹුරට අයත් ලොට් 20 සහ 19න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහලොවයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.40) ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියළුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/20 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

8. එකී ගිරාතලන ගමෙහි පිහිටි අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 19 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 18න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 3265ට අයත් ලොට් 20 න් ද, දකුණට : පාරෙන් ද (අධිවේගී), බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් දාසයයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 16.50) ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියළුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/21 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

9. එකී ගිරාතලන ගමෙහි පිහිටි අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 20 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 18න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : පාරෙන් ද (අධිවේගී), බස්නාහිරට : එම ඉඩමේම පිඹුරු අංක 3265ට අයත් ලොට් 19න් ද මායිම් වූ පර්චස් දාහතයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 17.75) ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියළුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1282/22 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

10. එකී ගිරාතලන ගමෙහි පිහිටි අන්දරලන්ද වත්ත, කෝංගහමුලහේන, කහටගහමුල්ලවත්ත සහ කෝංගහමුලහේන්යාය නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.08.27 සහ අංක 3265 දරන පිඹුර ප්‍රකාර ලොට් 12 ලෙස ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 11න් ද, නැගෙනහිරට : අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 13න් ද, දකුණට : ලොට් 14න් ද, බස්නාහිරට : එස්. බී. එම්. ජයසිංහට අයත් ලොට් 2න් ද මායිම් වූ පර්චස් පහලොවයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 15.40) ක් විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියළුම දේත් සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1113/230 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-424/4

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009 සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වනලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ජේ. එල්. සරත්චන්ද්‍ර මහතා විසින් සහතික කරනලද 2006.11.22 දිනැති අංක 192 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009 ජුනි මස 10 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් හාරලක්ෂ හැත්තෑහතර දහස් හත්සිය විසිහතරයි ශත හතලිස් හයක (රු. 4,74,724.46) මුදලක් සමඟ රුපියල් තුන්ලක්ෂ අනූහතර දහස් තුන්සිය හැත්තෑතුනයි ශත එකක (රු. 3,94,373.01) මුදලක් මත වසරකට සියයට විසිතුන (23%) බැගින් පොලියක්ද, 2009.07.11 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් රක්වාන, රඹුක, දුණුහිගේවත්ත හි පදිංචි ජයසුන්දර වීරකෝන් පියසීලි මැණිකේ මහත්මිය සහ අතුකෝරළ ගමගේ පොඩි මහත්මයා ජයරත්න මහතා යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. මහජන නොතාරිස් ජේ. එල්. සරත්චන්ද්‍ර මහතා විසින් සහතික කරන ලද 2006.11.22 දිනැති එකී අංක. 192 දරන බැඳුම්කරය මත අයවියයුතු එකී රුපියල් හාරලක්ෂ හැත්තෑහතර දහස් හත්සිය විසිහතරයි ශත හතලිස් හයක (රු. 4,74,724.46) මුදල සමඟ 2009.07.11 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවියයුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බදුල්ල, කලුගල්පිටිය, අංක 1/48හි පදිංචි වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, රක්වාන ශාඛාවේ කළමනාකරුටද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුළු කෝරලේ, උඩපත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමාවේ. රඹුකේ ග්‍රාමයේ පිහිටි දුණුහිගේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රමගේ විසින් සාදන ලද 2005.06.18 දිනැති අංක 1/7 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කර, නිරූපනය කර ඇති ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : FVP 943 හි ලොට් 344, 343, 862 සහ 863 ද, නැගෙනහිරට : FVP 943හි ලොට් 863, 864 සහ 364 ද, දකුණට : FVP 943 හි ලොට් 864, 364, 635, 634 සහ 352 සහ බස්නාහිරට : VC පාර සහ FVP 943 හි ලොට් 352 සහ 344 ද මායිම්ව ලොට් අංක 1/7 දරන පිඹුර ප්‍රකාර අක්කර දෙකයි පර්චස් එකක (අ. 2, රූ. 0, පර්. 1) ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී ලොට් 1 පහත විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමකි :

එකී රඹුකේ ග්‍රාමයේ පිහිටි දුණුහිගේවත්ත නමැති ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද 1983.12.28 දිනැති අංක S 55972 දරන පිඹුරේ ලොට් 353 (FVP 943හි) ලෙස දක්වා සීමා නිර්ණය කර නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 862 සහ 863 ද, නැගෙනහිරට: ලොට් 864 සහ 364 ද, දකුණට : ලොට් 635, 634 සහ 352 සහ බස්නාහිරට: V. C. පාර සහ ලොට් 344 ද, මායිම්ව අක්කර දෙකයි පර්චස් එකක (අ. 02, රූ. 0, පර්. 1) වපසරියකින් යුත් බිම් කැබැල්ල සමඟ

එහි ඇති සියලු දේද වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 208/162 යටතේ ලියාපදිංචි කර ඇත.

මේ සමඟ මෙයට එකී අංක 1/7 දරන පිඹුරෙහි ඇති සියළු පාරවල් හි මාර්ග අයිතිය ද ඇත.

ඩබ්ලිව්. සුමනසේන,
කළමනාකරු.

ලංකා බැංකුව,
රක්වාන.

06-389

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පානදුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : වීරකෝන් හෙට්ටිගේ ලලිත් මනෝහර ගෝමස්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2010.05.26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

එනම්, වීරකෝන් හෙට්ටිගේ ලලිත් මනෝහර ගෝමස් විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 3575 සහ 2007 අගෝස්තු මස 29 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 3575 දරන උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක්, 2009.12.29 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ පහළොස් දහස් තුන්සිය නමයයි ශත අසූතුන (රු. 3,15,309.83) ක මුදල සහ 2009.12.04 වැනි දින සිට රුපියල් දෙලක්ෂ අසූ අට දහස් අටසිය නමයයි ශත එකොළහ (රු. 2,88,809.11)ක මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ ඒ. කෙසේද යත්-

එකී අංක 3575 දරන උකස්කරය යටතේ අයවිය යුතු රුපියල් තුන්ලක්ෂ පහළොස් දහස් තුන්සිය නමයයි ශත අසූතුන (රු. 3,15,309.83) ක මුදල 2009.04.12 දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි පොලිය ද, ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛණයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරී සහ බලය පවරන ලෙසය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන පානදුර තල්පිටි දෙබැද්ද, මාලමුල්ල පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. එන්. වික්‍රමරත්න විසින් මැන සාදන ලද අංක 154 සහ 1993 ජූලි මස 30 දිනැති සැලැස්මේ ලොට් 5 වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : අංක 154 සැලැස්මේ ලොට් 4, නැගෙනහිරට : කරත්ත පාර, දකුණට : ඩී. ලිසිනෝනා හිමිකම් කියන කුරුඳුගහවත්ත හෙවත් අලුබෝගහවත්ත සහ බස්නාහිරට : එම්. කේ. නන්දාවතී හිමිකම් කියන දෙල්ගහවත්ත යන මායිම් තුළ පිහිටි එකී අංක 154 සැලැස්ම අනුව පර්චස් දාහතයි දශම පහ (අ. 0. රූ. 0, පර්. 14.5) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 266/37හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 5 දරන ඉඩම් කැබැල්ල මෑතක දී බලයලත් මානක ඩී. පී. ඒ. ජයවික්‍රම විසින් මැන සාදන ලද අංක 10778 සහ 2007 පෙබරවාරි මස 03 දිනැති සැලැස්මේ ලොට් 5ඒ වශයෙන් දක්වා ඇති අතර පහත දැක්වෙන අයුරු විස්තර කර ඇත :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන පානදුර තල්පිටි දෙබැද්ද මාලමුල්ල පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. පී. ඒ. ජයවික්‍රම විසින් මැන සාදන ලද අංක 10778 සහ 2007 පෙබරවාරි මස 03 දිනැති සැලැස්මේ ලොට් 5ඒ වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : නයනා දයාදරි සහ තිලක් චන්ද්‍රසිරි හිමිකම් කියන දෙල්ගහවත්ත සහ අංක 154 සැලැස්මේ ලොට් 4, නැගෙනහිරට : පාර (ප්‍රාදේශීය සභා), දකුණට : පුද්ගලික පාර සහ ඩී. ලිසිනෝනා හිමිකම් කියන කුරුඳුගහවත්ත හෙවත් අලුබෝගහවත්ත සහ බස්නාහිරට : නයනා දයාදරි සහ තිලක් චන්ද්‍රසිරි හිමිකම් කියන දෙල්ගහවත්ත යන මායිම් තුළ පිහිටි එකී අංක 10778 සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම තුනයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 13.30) ක් හෝ හෙක්ටයාර් 0.03364ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම්

06-451/5

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පානදුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : මුහන්දිරම්ගේ බන්දු ලක්සිරි රොඩ්රිගෝ.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2010.05.26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, මුහන්දිරම්ගේ බන්දු ලක්සිරි රොඩ්රිගෝ විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට දෙකම පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 3512 සහ 2006.05.10 සහ අංක 3622 සහ 2008.03.21 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක්, 2009.12.29 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අටලක්ෂ විසිඑක්දහස් හාරසිය හැත්තෑතුනයි ශත හැත්තෑව (රු. 8,21,473.70) ක මුදල සහ 2009.12.21 වැනි දින සිට රුපියල් හත්ලක්ෂ හැටඅට දහස් හත්සිය අටයි ශත තිස්හතර (රු. 7,68,708.34)ක මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ ඒ. කෙසේද යත් :

එකී අංක 3512 සහ 3622 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු රුපියල් අටලක්ෂ විසිඑක් දහස් හාරසිය හැත්තෑතුනයි ශත හැත්තෑව (රු. 8,21,473.70) ක මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි පොළිය ද, ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදියේ අංක 09හි පිහිටි එම්. එස්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු ශ්‍රියාණි මනම්පේරි වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරාන පිහිටි කොස්ගහවත්ත හෙවත් දෙල්ගහවත්ත නැමති ඉඩමට බලයලත් මානක එන්. ඒ. ඊ. ජේ. සිල්වා විසින් මැන සාදන ලද අංක 676 සහ 1995.06.15 දිනැති සැලැස්මේ ලොට් සී[5] හි ලොට් සී වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති උතුරට : පී. රම්‍යාවතී පීරිස් විසින් හිමිකම් කියන මෙම ඉඩමේම කොටසක්, නැගෙනහිරට : ලේනා ද සිල්වා හිමිකම් කියන මෙම ඉඩමේම කොටසක්, දකුණට : පානදුර සිට ගොනාබැද්දුව තොටුපලට දිවෙන පාර සහ බස්නාහිරට : අංක 676 සැලැස්මේ ලොට් සී4, සී3, සී2 සහ සී1 යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 27.40) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 357/288 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් සී[5] දරන ඉඩම් කැබැල්ල මැතකදී බලයලත් මානක වයි. කරුණාරත්න විසින් මැන සාදන ලද අංක 3601 සහ 2006 මාර්තු මස 07 දිනැති සැලැස්මේ ලොට් එක්ස් වශයෙන් දක්වා ඇති අතර එය උතුරට : පී. රම්‍යාවතී පීරිස් විසින් හිමිකම් කියන මෙම ඉඩමේම කොටසක්, නැගෙනහිරට : ලේනා ද සිල්වා හිමිකම් කියන මෙම ඉඩමේම කොටසක්, දකුණට : පානදුර සිට ගොනාබැද්දුව තොටුපලට දිවෙන ප්‍රධාන පාර සහ බස්නාහිරට : අංක 676 සැලැස්මේ ලොට් සී4, සී3, සී2, සහ සී1 යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3601 සැලැස්ම අනුව පර්චස් විසිහතයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 27.40) ක් හෝ හෙක්ටයාර් 0.06930ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 357/288හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම්

06-451/3

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පානදුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් විසින් කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ලේල්වල සන්ස් ගාමන්ට් ඉන්ඩස්ට්‍රීස්හි හවුල්කරුවන් වන කර්නල් වයනජිත් ලේල්වල සහ රසාරා ලසන්ති ලේල්වල.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2010.05.26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

එනම්, ලේල්වල සන්ස් ගාමන්ට් ඉන්ඩස්ට්‍රීස්හි හවුල්කරුවන් වන කර්නල් වයනජිත් ලේල්වල සහ රසාරා ලසන්ති ලේල්වල බන්ධනදායීයා වශයෙන් ද කර්නල් වයනජිත් ලේල්වල උකස්කරු වශයෙන් ද කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට දෙකම පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 3528 සහ 2006.10.03 සහ අංක 3596 සහ 2008.03.18 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක දරන උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක්, 2010.03.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ අසූහතරදහස් දෙසිය විසි පහයි ශත විසිහත (රු. 6,84,225.27) ක මුදල සහ 2010.02.26 වැනි දින සිට රුපියල් පන්ලක්ෂ හතලිස් තුන්දහස් නවසිය හැත්තෑ හයයි ශත හැටපහ (රු. 5,43,976.65)ක මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ ඒ. කෙසේද යත් :-

එකී අංක 3528 සහ 3596 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු රුපියල් හයලක්ෂ අසූහතර දහස් දෙසීය විසිපහයි ශත විසිහත

(රු. 6,84,225.27) ක මුදල 2010 පෙබරවාරි මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි පොලිය ද, ගාස්තු ද, අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන පානදුර තල්පිටි බැද්ද සරික්කාලිමුල්ලේ පිහිටි ගොඩපරගහවත්ත හෙවත් ගල්කොටුව නමැති ඉඩමට බලයලත් මානක වයි. බී. කේ. කොස්තා විසින් මැන සාදන ලද අංක 2820 සහ 1990.03.20 දිනැති සැලැස්මේ ලොට් 3 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : අංක 2819 සැලැස්මේ ලොට් 4 (පාර), නැගෙනහිරට : අංක 2819 සැලැස්මේ ලොට් 3, දකුණට : ගොඩපරගහවත්ත සහ පී. ඒ. ඩී. ඒබ්‍රහම්ගේ උරුමක්කරුවන් විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : අංක 2820 සැලැස්මේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ වේ. පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 319/307 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 3 දරන ඉඩම් කැබැල්ල තදනන්තරව බලයලත් මානක ඒ. ජී. සී. සිරිසෝම විසින් මැන සාදන ලද අංක 1590 සහ 1997 මැයි මස 12 දිනැති සැලැස්මේ ලොට් 3 වශයෙන් දක්වා ඇති අතර එය උතුරට : අංක 2820 සැලැසමේ ලොට් 4 (පාර), නැගෙනහිරට : අංක 2819 සැලැස්මේ ලොට් 3, දකුණට : පී. ඒ. ඩී. ඒබ්‍රහම්ගේ උරුමක්කරුවන් විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : අංක 1578 සැලැස්මේ ලොට් 2බී යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ වේ.

අංක 2819 සහ 2820 සැලැස්මේ ලොට් 4 සහ අංක 1590 සැලැස්මේ ලොට් 2බී සහ 3බී දරන බිම් කැබලි මත මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු-ණය අයකර ගැනීම්.

06-451/4

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 120007844.

ණය ගිණුම් අංකය : 231280.
ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2009 මැයි මස 29 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂිතයෙන්ම සහ ඒකඡන්දයෙන් නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2005 මාර්තු මස 21 වැනි දින සහතික කරන ලද අංක 160 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමටඩ් ණයකරු හැටියට ද, අරුණ පද්මසිරි රාජමන්ත්‍රී උකස්කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්දෙලක්ෂ අනූදෙදහස් තුන්සිය අසූඅටයි ශත අනූහයක (රු. 32,92,388.96) මුදලක් 2008 සැප්තැම්බර් මස 12 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිතුන් ලක්ෂ තිස් දෙදහස් හාරසිය හැට හතයි ශත එකොළහක් (රු. 23,32,467.11) මුදල අයකර ගැනීම සඳහා 2008 සැප්තැම්බර් මස 13 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට ප්‍රධාන හිඟ මුදල වන දහඅටලක්ෂය (රු. 18,00,000) ක මුදල මත 23%ක වැඩි දුර වාර්ෂික පොලිය ද, රුපියල් දහහතර ලක්ෂ අනූ දෙදහස් තුන්සිය අසූඅටයි ශත අනූහයක් (රු. 14,92,388.96) ක මුදල මත 33% වැඩිදුර වාර්ෂික පොළියක් ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් ගාස්තු ද මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් ඇතොත් ඒවා ද අඩුකොට එකී අංක 160 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක එස්. ඩී. චන්ද්‍රතිලක විසින් 1992 ඔක්තෝබර් මස 23 වැනි දින සාදන ලද අංක 1031 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ මහර කැන්දලියද්දපාළුව ග්‍රාමයේ පිහිටි ගලේවත්ත කියන ඉඩමට මායිම්, උතුරට : එච්. ඒ. සිරිවර්ධනයේ ඉඩම ද, නැගෙනහිරට : එච්. ඒ. ඩී. ඒකනායකගේ ඉඩම ද, දකුණට : අඩි 12 පාර සහ ඒ. ජේ. රාජමන්ත්‍රිගේ ඉඩම සහ ඕවිට ද, බටහිරට : ඕවිට සහ කුඹුර ද යන මායිම් තුළ අංක 1031 දරන පිඹුර පරිදි රූඩ් එකයි පර්චස් විසිඑකයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 21.50) විශාල ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යායේ C724/157 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-405

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මහරගම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී.එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : පෙන්ටැක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2010.05.26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්, පෙන්ටැක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් ද (බන්ධනදායියාගේ අධ්‍යක්ෂවරයකු වන) හරෙන්ද්‍ර මනෝජ් ද සොයිසා උකස්කරු වශයෙන් ද, කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට සියල්ලම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද අංක 1613 සහ 2008 අගෝස්තු මස 07, අංක 1662 සහ 2008 සැප්තැම්බර් මස 30 සහ අංක 1737 සහ 2009 මාර්තු මස 16 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 1613, 1662 සහ 1737 දරන උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක්,

(1) 2010.03.09 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැත්තෑ පන්ලක්ෂ අසූහත් දහස් එකසිය පනස් දෙකයි ශත තිස්අට (රු. 75,87,152.38) ක මුදල හා 2010.03.01 දින සිට රුපියල් හැත්තෑ එක්ලක්ෂ පනස්දහස (රු. 71,50,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් පොළිය ද සහ රුපියල් හැත්තෑ එක්ලක්ෂ පනස් දහස (රු. 71,50,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

(2) 2010.03.09 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හතලිස් හයලක්ෂ අසූපන් දහස් දෙසීය දොළහයි ශත විසිහත (රු. 46,85,212.27) ක මුදල හා 2010.03.05 දින සිට රුපියල් හතලිස් තුන්ලක්ෂ පනස් දහස් හත්සිය විසිඅටයි ශත අනූව (රු. 43,50,728.90) ක මුදල මත වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද,

(3) 2010.03.09 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් පනස් පන්ලක්ෂ අසූතුන් දහස් අනූ නමයයි ශත විසිතුන (රු. 55,83,099.23) ක මුදල හා 2010.03.08 දින සිට රුපියල් පනස් එක්ලක්ෂ අසූහය දහස් එකසිය පහයි ශත හැටඅට (රු. 51,86,105.68) ක මුදල මත වර්ෂයකට සියයට විසිනමය (29%) බැගින් පොළිය ද,

(4) 2010.03.09 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස්ලක්ෂ හැත්තෑ හයදහස් නමසිය නමයයි ශත විසිහය (රු. 30,76,909.26) ක මුදල හා 2010.02.21 දින සිට රුපියල් විසිනම ලක්ෂ අට දහස (රු. 29,08,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොළිය ද,

(5) 2010.03.09 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස්එක් ලක්ෂ හැත්තෑහතර දහස් අසූදෙකයි ශත දාහත (රු. 31,74,082.17) ක මුදල හා 2010.03.10 දින සිට රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොළිය ද

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ, ඒ කෙසේද යත් -

එකී අංක 1613, 1662 සහ 1737 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් දෙසිය හතලිස් එක්ලක්ෂ හයදහස් හාරසිය පනස් පහයි ශත තිස් එක (රු. 2,41,06,455.31) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි පොළිය ද, ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ පිළියන්දල කොලමුන්න පිහිටි ආටිගල මාවත වරිපනම් අංක 98 දරන මහවත්ත හෙවත් පැලවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. එල්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 2132 සහ 1987 ජූලි 20 දිනැති අංක සැලැස්මේ ලොට් 1, 2. 3 සහ 4 වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර එකිනෙකාට යාබදව පිහිටි උතුරට : අති උතුම් ශ්‍රීමත් ජෝන් කොතලාවලට අයත් මහවත්ත හෙවත් වලව්වත්ත, නැගෙනහිරට : අති උතුම් ශ්‍රීමත් ජෝන් කොතලාවලට අයත් මහවත්ත හෙවත් වලව්වත්ත ගාර්ඩින්, දකුණට : පාරක් සඳහා වෙන් කරන ලද බිම් කොටස සහ බස්නාහිරට : එකී අංක 2132 සැලැස්මේ ලොට් 5 යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දොළහ (අ. 0. රූ. 1, පර්. 12) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේ වේ. ගල්කිස්ස (දැනට දෙල්කඳ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2632/99හි ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන ඉඩම් කැබලිමත මාර්ග අතියිය ද සමගින් වේ.

(අ) බස්නාහිර පළාතේ, කොළඹ දිස්තික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ පිළියන්දල කොලමුන්න පිහිටි මහවත්ත හෙවත් පැලවත්ත නමැති ඉඩමට බලයලත් මානක එච්. එල්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 2132 සහ 1987 ජූලි මස 20 දිනැති සැලැස්මේ ලොට් 6 (පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබැල්ල) ගල්කිස්ස (දැනට දෙල්කඳ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2065/234හි ලියාපදිංචි කර ඇත.

(ආ) බස්නාහිර පළාතේ, කොළඹ දිස්තික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ පිළියන්දල කොලමුන්න පිහිටි මහවත්ත හෙවත් පැලවත්ත නමැති ඉඩමට බලයලත් මානක ටී. ඒ. බූරා විසින් මැන සාදන ලද අංක 1067 සහ 1971 සැප්තැම්බර් මස 10 දිනැති සැලැස්මේ ලොට් 1 (පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබැල්ල) ගල්කිස්ස (දැනට දෙල්කඳ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2316/239හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්සයේ සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ පිළියන්දල කොලමුන්න

පිහිටි ආටිගල මාවත, වරිපනම් අංක 96ඒ දරන මහවත්ත හෙවත් පැලවත්ත හෙවත් වලව්වත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 1324/ඒ2 සහ 2001 ඔක්තෝබර් මස 10 දිනැති සැලැස්මේ ලොට් A2A වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : බලයලත් මානක එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 1324 සහ 2001 මාර්තු මස 22 දිනැති සැලැස්මේ ලොට් ඒ2හි ඉතිරි කොටස. නැගෙනහිරට : ලොට් ඒ2 හි ඉතිරි කොටස, දකුණට : බලයලත් මානක ලාල් ගුණසේකර විසින් මැන සාන ලද අංක 2122 සහ 1981 ජූලි මස 20 දිනැති සැලැස්මේ ලොට් 3 සහ 4, බස්නාහිරට : සී ද සොයිසා ට සහ තවත් අයට අයත් ඉඩම් යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0. පර්. 16.50) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේ වේ. ගල්කිස්ස (දැනට දෙල්කඳ) ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2565/217හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම්.

06-451/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුවරඑළිය ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.16 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0190-01180104-001/002 සහ 0190-02350680-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. එන්. ඩී. වැලිඅංග විසින් සහතික කරන ලද 2006 සැප්තැම්බර් මස 06 දිනැති අංක 400 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, නුගේගොඩ එන් (පීවීඑස්) 30699 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ද හෙරිටේජ් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්, දෙදෙනාම කෝට්ටේ පදිංචි බෝපේආරච්චිගේ ප්‍රේම්නාත් රොනල්ඩ් පෙරේරා සහ ටිකිරිය වරුණගේ කොන්ස්ටන්ස් චාමලීන් නිලන්ති පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින්, එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි විසිලක්ෂ තිස්එක්දහස් පන්සිය දහසයයි ශත එකොළහක (රු. 1,20,31,516.11) මුදලක්, 2009 මැයි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,20,31,516.11 මුදලද, 2009 ජුනි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 400 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභා සීමාව තුළ පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ජී. ගුණතිලක විසින් සාදන ලද 2000 මාර්තු මස 03 දිනැති අංක 1255 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එගොඩපොතුවිල කුඹුර නමැති ගස්, වගා, බිම හා එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් 10 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ඊ. කේ. නානායක්කාර විසින් සාදන ලද 1998 අප්‍රේල් 15 දිනැති අංක 416/98 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට්ස් 12 සිට 29 දක්වා පවත්නා මායිම් තුළ කොටසක නැවත මැනීමක්, එකතුවක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : ලොට් 9 ද, ගිණිකොණට : පීපීකො 7389/28 ද, නිරිතට : ලොට් 11 සහ වයඹට : ලොට් 13 ද යන මායිම් තුළ පර්චස් නවයයි දශම එකයි නවයක් (අ. 0, රූ. 0, පර්. 9.19) නොහොත් හෙක්ටයාර් 0.02324 ක් විශාල ඉඩම.

එකී ගැණුම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පෙර කියන ලද සහ හෝ සිය කුලීකරුවන්ගේ, සේවකයින්ගේ, කම්කරුවන්ගේ, ආගන්තුකයන්ගේ සහ සමාන අයිතිවාසිමක් ඇති සියලු අන් අයගේ හෝ ඔවුන් විසින් බලය දෙනු ලබන අයගේ පූර්ණ සහ නිදහස් අයිතිය, නිදහස, අවසරය සහ බලපත්‍රය ඇතිව පහත විස්තර කරනු ලබන මාර්ග සඳහා වෙන් කිරීම් දිගේ සහ උඩින් බර පැටවූ හෝ නොපැටවූ වාහන ඇති හෝ නැතිව යාමට, පසුකර යාමට සහ නැවත යාමට සහ ඉහත විස්තර කරනු ලබන එකී ලොට් 10යේ භුක්තියට අදාළ සියලු කාරණාවන්ට එකී ගැණුම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පෙර කියන ලද අයගේ ප්‍රයෝජනය සහ යහපත සඳහා එකී වෙන් කිරීම දිගේ සහ උඩින් ජලබස්නා ක්‍රම සහ විදුලි කේබල් සහ උඩු රැහැන් සහ වෙනත් අත්‍යවශ්‍ය උපක්‍රම යෙදීමට නමුත් එවැනි අයිතිවාසිකම් භාවිතා කිරීමේ යම්කිසි ආකාරයකින් හෝ ක්‍රමයකින් එවැනි සමාන අයිතිවාසිකම් හිමි අන් අයගේ අයිතීන්ට බාධා නොවන අයුරු විය යුතුය.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ පිහිටි පිටකෝට්ටේ ආනන්ද බාලිකා මාවත ජයසිංහ ගාඩ්න්ස් පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 08 දිනැති අංක 967 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කලින් එගොඩපොතුවිල කුඹුර නමැති ජයසිංහ ගාඩ්න්ස් යනුවෙන් හඳුන්වන ඉඩමේ ලොට් සී ලකුණු කළ (අඩි 30ක් පළල පාර), (එගොඩපොතුවිල කුඹුරේ ලොට් බී හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් බී සහ ඇල ද, නැගෙනහිරට : අංක 834 දරන සැලැස්මේ සඳහන් ලොට්ස් 7, 8 සහ 9 සහ ලොට් ඩී ද, දකුණට : අංක 966 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 සහ බස්නාහිරට : පාර ලොට් බී සහ ඒ සහ අංක 834 දරන සැලැස්මේ සඳහන් ලොට්ස් 4 සහ 5 ද යන මායිම් තුළ එකී අංක 967 දරන සැලැස්ම අනුව පර්චස් විසිහතරයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 24.40) විශාල ඉඩම.

2. පෙර කී පිටකෝට්ටේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ජී. ගුණතිලක විසින් සාදන ලද 2000 මාර්තු 03 වැනි දිනැති අංක 1255 දරන එකී සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එගොඩපොතුවිල කුඹුර නමැති

ඉඩමේ ලොට් 13 ලකුණු කල (පාර සඳහා වෙන් කිරීම) (අංක 416/98 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට්ස් 12 සිට 29 දක්වා පවත්නා මායිම් තුළ කොටසක නැවත මැනීමක් එකතුවක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : ලොට් 1, 5, 6 සහ 7 ද, ගිණිකොණට : ලොට් 8, 9, 10, 11, 12, 14, 17, 18 සහ 21 ද, නිරිතට : ලොට් 14, 15 සහ ඇල ද සහ වයඹට : ලොට් 1, 2, 3, 4 15, 16, 19, 20. 22 ද යන මායිම් තුළ එකී අංක 1255 දරන සැලැස්ම අනුව පර්චස් තිස්පහයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 35.85) නොහොත් හෙක්ටයර් 0.09066 ක් විශාල ඉඩම.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-415/4

---

## මහජන බැංකුව - කඩුවෙල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද 2006.06.06 දින හා අංක 329 දරන සහ නීතිඥ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. කේ. ගුණපාල මහත්මිය විසින් සහතික කරන ලද අංක 304 සහ 2009.08.08 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම සනත් රාජා පලිහේන මයා සහ අජන්තා ජානකී පලිහේන මහත්මිය (හෙවත්) පලිහේන දෝන අජන්තා ජානකී විසින් පැහැර හැර ඇති හෙයින් දැන් එකී අංක 329 හා 304 දරන බැඳුම්කර මත රුපියල් එක්ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසීයයක (රු. 1,72,440) මුදලක් සහ රුපියල් හාරලක්ෂ හැටහත්දහස් අසූතුනයි ශත තිස් හතරක (රු. 4,67,083.34) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් එක්ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසීයයක (රු. 1,72,400) එකී මුදල ද, රුපියල් හාරලක්ෂ හැටහත් දහස් අසූතුනයි ශත තිස් හතරක (රු. 4,67,083.34) එකී මුදල ද, 2009.10.09 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් එක්ලක්ෂ හැත්තෑ දෙදහස් හාරසීයයක (රු. 1,72,400) මුදලක් මත වර්ෂයට සියයට විසිඑකයි දශම පහ (21.5%) බැගින් තවදුරටත් පොළිය ද, 2009.10.09 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හාරලක්ෂ හැටහත් දහස් අසූ තුනයි ශත තිස් හතරක (රු. 4,67,083.34) මුදලක් මත වර්ෂයකට සියයට විසිපහයි දශම පහ (25.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 329 හා 304 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව (කඩුවෙල උප කාර්යාලය) ඇතුළත කොතලාවල ගමේ පිහිටියා වූ ද, අවිස්සාවේල්ල පාරේ වරිපනම් අංක 200 දරන්නා වූ ද, "කැළණි විහාර ඕවිට හෙවත් කඩුවෙල ඕවිට" යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ජයසූරිය විසින් සාදන ලද අංක 3349 හා 2005 අප්‍රේල් මස 7 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට නිරූපිණය කර ඇත්තා වූ ද, උතුරට : පාර ද, නැගෙනහිරට : අංක 389 පිඹුරේ ලොට් B දරන කොටස ද, දකුණට : ලොට් අංක 2 ද, බස්නාහිරට : පාර ද මායිම් වන්නා වූ ද එකී අංක 3349 දරන පිඹුරට අනුව පර්චස් තිස් එකක් (අ. 0, රූ. 0, පර්. 31) විශාල වූ ද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1615/118 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි සියලු දේත් ය.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1615/118 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

06-346

---

## සෙලාන් බැංකුව පීඑල්සී - කොට්ටාව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 0330-0123030309-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවු 9) යටතේ ලියාපදිංචි කර ඇත. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. කේ. විජේරත්න විසින් සහතික කරන ලද 2006 ජනවාරි 26 වැනි දිනැති අංක 707 දරන බැඳුම්කරය

සහ 2005 පෙබරවාරි 9 දිනැති යොමු අංක එම්සීඑච්/කේඕටී/2005/001 දරන වංචල උකස් ඔප්පුව මත අයවිය යුතු මුදල් ගෙවීම, පන්නිපිටිය සංස්ථාගත කිරීමේ සහතික අංක එන්(පීවීඑස්) 32191 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන සප්ලයි රූම් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ පන්නිපිටිය සංස්ථාගත කිරීමේ සහතික අංක : එන් (පීවීඑස්) 32190 දරන අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන ඒ. එම්. ආර්. ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ ලංකා රුපියල් පහසුකම්, වාරණය (ඇමෙරිකානු ඩොලර් පහසුකම) සහ විදේශ මුදල් ණය (ඇමෙරිකානු ඩොලර් පහසුකම) වශයෙන් රු. දසකෝටි තිස්තුන්ලක්ෂ අනූහතරදහස් විස්සයි ශත අසූදෙකක (රු.10,33,94,020.82) මුදලක් 2009 ජනවාරි 31 වැනි දින විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 10,33,94,020.82 මුදලද, 2009 පෙබරවාරි 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, ලංකා රුපියල් පහසුකම් සඳහා වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් සහ වාර ණය (ඇමෙරිකානු ඩොලර් පහසුකම) සඳහා වර්ෂයකට සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය + ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අයකරන ලද දඩ පොලී ප්‍රතිශත සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදන්නතරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 707 සහ එම්සීඑච්/කේඕටී/2005/001 දරන වංචල උකස් ඔප්පුව දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් 1 වැනි 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ වංචල දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ (ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ නගර සභා සීමාව තුල දෙපානම පන්නිපිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් සාදන ලද 2005 අගෝස්තු 18 දිනැති අංක 229/2005 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙනියවත්ත හෙවත් නුගගහලන්දවත්ත හෙවත් නුගගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බොරැල්ල පාර වරිපනම් අංක 134 දරන ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදූ ඉඩම් කොටසට මායිම් : උතුරට : මීටර් හතරයි දශම පහක් පළල පාර, ඒ. ආරොන් පෙරේරා විසින් හිමකම් කියනු ලබන නුගගහවත්ත, පී. ඒ. පෙරේරා සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන වඩදොඹගහවත්ත ද, නැගෙනහිරට ඒ. මීපාගල සහ පී. පී. ගුරුගේ සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන අඳුනේවැන්නේගහකුඹුර ද, දකුණට : බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් සාදන ලද අංකः 81/1997 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 බී සහ මීටර් 9 ක් පළල පාර සහ බස්නාහිරට : බොරැල්ල පාර, ඒ. ආරෝන් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන නුගගහවත්ත සහ පී. ඒ. පෙරේරා සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන බටදොඹගහවත්ත යන මායිම් තුල අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් තිස්හතරක් (අ. 2, රූ. 2, පර්. 34) විශාල ඉඩම.

පහත විස්තර කරනු ලබන පාර සඳහා වෙන්කිරීම තුල උඩින් සහ යටින් සහ දිගේ මාර්ග අයිතිය සහ අනිකුත් සියලු අයිතීන් සමග.

පෙරකී දෙපානම පන්නිපිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් සාදන ලද 1992 සැප්තැම්බර් මස 22 වැනි දිනැති අංක 943 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බත්තරමුල්ලේ සිට පන්නිපිටිය දක්වා ප්‍රධාන පාරේ සිට දෙනියවත්ත හෙවත් නුගගහලන්දවත්ත හෙවත් නුගගහවත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණුකල (අඩි 30 ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදූ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : අංක 1791 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ, එකී අංක : 943 දරන සැලැස්මේ සඳහන් ලොට් 1, 3 සහ 4 ද, දකුණට : බත්තරමුල්ල සිට පන්නිපිටිය දක්වා ප්‍රධාන පාර, අංක : 17/91 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ සහ එකී අංක : 943 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 සහ බස්නාහිරට : බත්තරමුල්ල සිට පන්නිපිටිය දක්වා ප්‍රධාන පාර, අංක 17/91 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ සහ එකී අංක : 943 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, යන මායිම් තුල එකී අංක : 943 දරන සැලැස්ම අනුව පර්චස් තිස්නවයයි දශම පහයි හතක් (අ. 0, රූ.0, පර්. 39.57) විශාල ඉඩම.

### දෙවැනි උපලේඛනය

(i) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දෙපානම බොරැල්ල පාර වරිපනම් අංක 134 දරන පරිශ්‍රය තුල සහ මත බහා ඇති පාවිච්චිකල සහ පසුව ප්‍රතිසංස්කරණය කරන ලද 250කේවීඒ කමින්ස් පී 250 වර්ගයේ ධවනිරෝධක ඩීසල් විදුලි ජනක යන්ත්‍රයකින් සමන්විත සියලු සහ තනි ව්‍යාපාර බඩු තොග ද්‍රව්‍ය නිමි සහ නොනිමි භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, උපකරණ, බඩුබාහිරාදිය සහ දේවල් සහ වෙනත් සියලු භාණ්ඩ සහ එක්ව සහ වෙන් වෙන්ව ලීබඩු, සවිකිරීම් සහ ද්‍රව්‍ය සහ සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක අනිකුත් වංචල දේපළ සහ (ඒ සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින් මතු බන්ධනදායීට හිමි ව්‍යාපාර බඩු තොග, ද්‍රව්‍ය, නිමි සහ නොනිමි භාණ්ඩ, යනුවෙන් සාමුහිකව හඳුන්වනු ලැබේ.) බන්ධනදායී විසින් දැන් සහ හෝ කවර කලක හෝ මින් මතු කලින් කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය කර ගෙන යනු ලබන්නාවූ සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි හෝ බන්ධනදායීන්ගේ නිමි සහ නොනිමි ව්‍යාපාර බඩු තොග සහ ද්‍රව්‍ය හෝ කලින් කලට සහ මින්මතු මෙම බැඳුම්කරය වලංගුව පවත්නා සියළු කාලයන්හි බන්ධනදායී විසින් ඕනෑම වෙලාවක සහ මින්මතු කලින් කලට රැගෙන ගොස් ව්‍යාපාර කරගෙන යනු ලබන වෙළඳාම කරනු ලබන හෝ ගුදම් කරනු ලබන සියළු හෝ ඕනෑම ස්ථානයක හෝ ස්ථානයන්හි ඇති හෝ ගෙනෙන ලද නිමි හෝ නොනිමි වෙළඳ බඩු තොග සහ ද්‍රව්‍ය සහ අනිකුත් සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක අනිකුත් වංචල දේපළ.

(ii) එක්ව සහ වෙන් වෙන්ව ඇති ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ පාවිච්චි කල සහ පසුව ප්‍රතිසංස්කරණය කරන ලද 250 කේවීඒ කමින්ස් පී 250 වර්ගයේ ධවනිරෝධක ඩීසල් විදුලි ජනක යන්ත්‍රයකින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ, මේවා මින් පසු බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ රේගුවේ සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යයක්ම මෙහිමින් මතු බන්ධනදායීට හිමි වරාය ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමුහිකව හඳුන්වනු ලැබේ.

(iii) එක්ව සහ වෙන් වෙන්ව ඇති ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ පාවිච්චි කල සහ පසුව ප්‍රතිසංස්කරණය කරන ලද 250 කේවීඒ කමින්ස් පී 250 වර්ගයේ ධවනිරෝධක ඩීසල් විදුලි ජනක යන්ත්‍රයකින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ. (බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක ගුවන් තොටුපලේ ගබඩාවල සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යක්ම මෙහි මින් මතු බන්ධනදායීට හිමි ගුවන් තොටුපල ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමුහිකව හඳුන්වනු ලැබේ.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

06-415/1

### මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.10.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ඒ. දීප්ති ආර්. මෙන්ඩිස් විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2005.09.09 දිනැති අංක 2391 දරන උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. ආර්. එස්. අබේරත්න විසින් ලියා සහතික කරන ලද 2006.11.09 දිනැති අංක 1961 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොස්වත්තගේ අමල් සහ ආරියසිංහ නිරෝෂා ලක්මිණි කුලතුංග විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 2391 සහ 1961 දරන උකස්කරය මත රු. 5,488,257.75 (රුපියල් පනස්හතරලක්ෂ අසූඅටදහස් දෙසීය පනස් පහයි ශත හැත්තෑපහක) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද,

2009.04.25 වැනි දින සිට වර්ෂයකට 20.5% (සියයට විස්සයි දශම පහ) බැගින් රු. 3,680,551.63 (තිස්හයලක්ෂ අසූදහස් පන්සිය පනස් එකයි ශත හැටතුනක්) මුදල සහ 2009.04.25 වැනි දින සිට වර්ෂයකට 26% (සියයට විසිහය) බැගින් රු. 1,690,126.01 (රුපියල් දහසයලක්ෂ අනූදහස් එකසියවිසිහයයි ශත එකක) මුදල සහ 2009.08.01 වැනි දින සිට වර්ෂයකට 23% (සියයට විසිතුනක) බැගින් රු. 117,580.11 (රුපියල් එක්ලක්ෂ දාහත්දහස් පන්සිය අසූවයි ශත එකොළහක) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රු. 5,488,257.75 (රුපියල් පනස්හතරලකෂ අසූඅටදහස් දෙසීය පනස්හතයි ශත හැත්තෑපහක) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා විසින් එකී 2005.09.09 දිනැති අංක. 2391 සහ 2006.11.09 දිනැති අංක 1961 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටා ඇති "ඇලබොඩකුඹුර, පරණඇලකණ්ඩිය, ලන්සියදෙනිය සහ ඇලබොඩදෙනිය" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ගාර්දිහේවා විසින් 2005 ජූලි 29 වැනි දින මැන සාදන ලද අංක 0159 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 2" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට, අංක 926 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 28 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 926 දරන පිඹුරේ ලොට් 26 සහ බටහිරට : මෙෂනරි පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම අටයි නවයක් (අ. 0, රූ. 0, පර්. 20.89) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේ ද වේ.

ඉහත සඳහන් ලොට් 2, පහත විස්තර කරනු ලබන ලොට් 27 හි නැවත මැනුමකි.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කෝට්ටේ ගල්කිස්ස ගම්සභා සීමාව තුළ බොරලැස්ගමුව උතුර රත්තනපිටියේ පිහිටා ඇති වරිපනම් අංක 30/70 දරන පරිශ්‍රය, "ඇලබොඩකුඹුර, පරණ ඇලකණ්ඩිය, ලන්සියදෙනිය සහ ඇලබොඩදෙනිය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1969 අගෝස්තු 9 වැනි දින මැන සාදන ලද අංක 926 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 27" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 28 සහ 45 ද, නැගෙනහිරට : විද්‍යොදය විශ්ව විද්‍යාලයේ පරිශ්‍රය ද, දකුණට : ලොට් 26 සහ බටහිරට : ලොට් 51 ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසිඑකයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 21.7) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේද වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2469/142 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන පාරක් සඳහා වෙන් කරන ලද කොටස මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත කී පරිදි බොරලැස්ගමුව පිහිටා ඇති "ඇලබොඩකුඹුර, පරණ ඇලකණ්ඩිය, ලන්සියදෙනිය සහ ඇලබොඩදෙනිය" නමැති ඉහත කී ඉඩමේ අංක 0159 පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 1" දරන ඉඩම් කොටසට මායිම් : උතුරට අංක 926 දරන පිඹුරේ ලොට් 11 ද, නැගෙනහිරට : මෙෂනරි කාණුව අංක 926 දරන පිඹුරේ 28 සහ ලොට් 2 ද, දකුණට : අංක 926 දරන පිඹුරේ ලොට් 12 සහ ලොට් 2 සහ බටහිරට : පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්. 3.56) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේ ද වේ.

ඉහත සඳහන් "ලොට් 1" පහත විස්තර කරනු ලබන ලොට් 45 හි නැවත බෙදුමකි.

ඉහත කී පරිදි බොරලැස්ගමුව පිහිටා ඇති "ඇලබොඩකුඹුර, පරණ ඇලකණ්ඩිය, ලන්සියදෙනිය සහ ඇලබොඩදෙනිය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1969 අප්‍රේල් 22 වැනි දින මැන සාදන ලද අංක 926 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද "ලොට් 45" දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 11 සහ 50 ද, නැගෙනහිරට : ලොට් 27 සහ 28 ද දකුණට : ලොට් 12 සහ 51 සහ බටහිරට : ලොට් 41 ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතරක් (අ. 0, රූ. 0, පර්. 4) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M959/266 සහ M2377/210 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01.

06-339

## මහජන බැංකුව - ඒකාබද්ධ බැංකු අංශය

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, එල්. මනුජ නාරංගොඩ විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2006.09.26 දිනැති අංක 1151 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. එච්. ලලනි පෙරේරා විසින් ලියා සහතික කරන ලද 2007.10.02 දිනැති අංක 1232 දරන උකස්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, සීමාසහිත එම්. එස්. ගාමට් ගෲරූෆ් 5 (පෞද්ගලික) ආයතනය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය මත රුපියල් හැත්තෑහයලක්ෂ අනූහත්දහසක (රු. 76,97,000) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතු සහ අයවිය යුතු බැවින් ද, 2009.09.25 වන දින සිට වර්ෂයකට සියයට දහයයි දශම දෙකයි පහ (10.25%) බැගින් රුපියල් පනස්ලක්ෂ හැත්තෑදෙදහස් එකසිය අනූදෙකක (රු. 50,72,192) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ ඩොලර් 21,534.00 මුදල සඳහා Libor 3% වෙන්දේසි ගාස්තු ද සහ එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගත හැකි මුදල් සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් හැත්තෑහයලක්ෂ අනූහත්දහසක (රු. 76,97,000.00) මුදල අයකරගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර එම්. එස්. ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 1151 සහ 1232 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගෝනහේන ගමේ පිහිටා ඇති මිල්ලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එම්. ලීලරත්න විසින් 2000.01.05 වන දින මැන සාදන ලද අංක 24 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් "ඒ" දරන ඉඩම් කොටසට මායිම්, උතුරට: එස්. කේ. කරතේලිස් පෙරේරාගේ උරුමකරුවන්ට වෙන් කරන ලද මිල්ලගහවත්තේ ලොට් බී ද, නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : ලොට් බී සහ බටහිරට : මීගහවත්තට යන පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 24 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකයි පර්චස් විසිනවයක් (අ. 0, රූ. 2, පර්. 29) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි හතයි පහයි අටක් (හෙක්ටයාර් 0.2758) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැවිලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 628/147 සහ 628/623 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජ්‍යෙෂ්ඨ කළමනාකරු,
(පාරිභෝගික සම්බන්ධතා - 3)

මහජන බැංකුව,
ඒකාබද්ධ බැංකු අංශය,
35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

06-355

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 2007.02.28 දිනැති අංක 5279 දරන බැඳුම්කරය හා 2008.06.27 දිනැති අංක 5771 දරන බැඳුම්කරය මත ණය සහ අයිරා ගිණුම් මත මුල් මුදල සහ 2010.01.12 දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිහත්ලක්ෂ දොළොස් දහස් දෙසිය අසූපහයි ශත අනූහයක (රු. 27,12,285.96) මුදලක් සමග ණය ගිණුම (1) සඳහා රුපියල් හාරලක්ෂ අනූහතර දහස් නවසිය අනූඅටක (රු. 4,94,998) මුදලක් මත වර්ෂයකට සියයට විසිහතයි දශම පහ (27.5%) බැගින් ද, ණය ගිණුම (II) සඳහා රුපියල් තුන්ලක්ෂ අසූපන් දහස් හයසිය හැත්තෑහතයි ශත විසිතුනක (රු. 3,85,677.23) මුදලක් මත වසරකට සියයට විසිහතයි දශම පහ (27.5%) බැගින් පොලිය ද, අනුමත කළ සීමාව වන රුපියල් එකොළොස් ලක්ෂ විසිතුන් දහස් හයසිය දාහතයි ශත අසූහතක (රු. 11,23,617.87) මුදලක් දක්වා වසරකට සියයට විසිනවය (29%) බැගින් පොලියක් ද 2010.01.13 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් අංගොඩ, මහබුත්ගමුව, අශෝක් විලේජ් හි, අංක 39/3එම් හි පදිංචි අබ්දුල් ජබාර් මොහොමඩ් ජිෆ්රි කාන් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 5771 සහ 5279 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිහත් ලක්ෂ දොළොස් දහස් දෙසිය අසූපහයි ශත අනූහයක (රු. 27,12,285.96) මුදල සමග 2010.01.13 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, මධ්‍යම වෙළඳපොල ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අඹතලෙන් පහළ අලුත්කුරු කෝරලේ දකුණ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ මහ බුත්ගමුව පිහිටි, දත් ඇල පාරේ, වරිපනම් අංක 769 දරන උෂඹවත්ත, හීනැටිඹිවිටවත්ත, කුඹවෙලකුඹුර, මිදිගහඹිවිට නොහොත් හුඹස්වටඹිවිට, මිදිගහවත්ත, හීනටිඹිවිට, බුත්ගමුවඹිවිට සහ කිරිවැල්ලදෙණියඹිවිට නැමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු බන්දුල රණතුංග විසින් සාදන ලද 2003 ජනවාරි 28 දිනැති අංක 17/2003 දරන පිඹුරෙහි ලොට් 6 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 6 උතුරට : පාර (බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද 2002 ජූලි 14 දිනැති අංක 4069 දරන පිඹුරෙහි ලොට් 2 එම්) සහ ලොට් 1 සහ 2 ද, නැගෙනහිරට : ලොට් 2 සහ 5 ද, දකුණට: ලොට් 5 සහ 7 ද, බස්නාහිරට : පාර (පිඹුරු අංක 4069 හි ලොට් 2එම්) ද, මායිම්ව එකී අංක 17/2003 දරන පිඹුරට අනුව පර්චස් හතරයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 4.25) (හෙක්ටයාර් 0.01075) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සහ වැවෙන ගහකොළ වැවිලි සහ ගොඩනැගිලි

ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 904/29 හි ලියාපදිංචි කර ඇත.

එන්. ඩී. එල්. පුෂ්පකුමාර,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මධ්‍යම වෙළඳපොල ශාඛාව.

06-390

---

### මහජන බැංකුව - කඩුවෙල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද 2008.12.03 දිනැති අංක 1203 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම අනිල් ගාමිණී ලියනආරච්චි මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් හාර ලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත අසූ අටක (රු.4,16,666.88) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.10.04 දින සිට වර්ෂයකට සියයට විසි හය බැගින් (26%) හා හාරලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි සත අසූ අටක (රු.4,16,666.88) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී හාරලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත අසූ අටක් (රු.4,16,666.88) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 1203 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණීය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, වැලිවිට යන ගම පිහිටි "බෝගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර මහතා විසින් 1999.08.03 වන දින මැන සාදන ලද අංක 2594 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල ලොට් අංක 1 දරන කොටසට මායිම්, උතුරට : ඩී. අතුකෝරල සහ තවත් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර මහතාගේ 1997.10.19 දිනැති පිඹුරු අංක 2059 හි ලොට් අංක 1 සහ 3 ද, දකුණට : පාර ද, බස්නාහිරට : එස්. ලියනගේ යන අයට අයත් ඉඩමද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 10.5) විශාල ඉඩම සහ එහි තුල පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

ඉහත සඳහන් ඉඩම වනාහි පහත සඳහන් ඉඩම් ඒකාබද්ධ කර මැන සාදන ලද්දකි.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, වැලිවිට යන ගම පිහිටි, "බෝගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර මහතා විසින් 1997.10.04 වැනි දින මැන සාදන ලද අංක 2045 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල ලොට් අංක 1 දරන කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කොටසක් ද, දකුණට : පාර ද, බස්නාහිරට : එස්. ලියනගේ ට අයත් ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6.0) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොල, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

2. ඉහත කී වැලිවිට යන ගම පිහිටි, "බෝගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රවීන්ද්‍ර කරුණාසේකර මහතා විසින් 1998.11.20 වැනි දින මැන සාදන ලද අංක 2353 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 1 දරන කොටසට මායිම්, උතුරට : ටී. අතුකෝරාල සහ තවත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : අංක 2059 දරන පිඹුරේ ලොට් 01 සහ 03 දරන කොටස්වලින් කොටසක් ද, දකුණට : අංක 2045 දරන පිඹුරේ ලොට් 01 ද, බස්නාහිරට : එස්. ලියනගේ ට අයත් ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 4.5) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි පර්චස් හතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 4.5) විශාල ඉඩම සහ එහි තුල පිහිටි ගහකොල, පලතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම උකස්කරය G1337/91 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කළාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

06-347

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංක : 1117003618.
ණය ගිණුම් අංක : 388773 සහ 389029.

නා ට්‍රී කේටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2009 ඔක්තෝබර් මස 23 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2007 අගෝස්තු මස 30 වන දින සාදන ලද අංක 3606 දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2008 ජුනි මස 20 වැනි දින සාදන ලද අංක 1320 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමාගම් පනත ප්‍රකාර ස්ථාපිත නාවල පරණ පාරේ අංක 93/2 හි ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන නා ට්‍රී ක්වෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට ද සහ කොටදූව ආරච්චිගේ විරාන් ඉන්දික පෙරේරා උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පහළොස් මිලියන එකසිය තිස්නව දහස් හයසිය හැත්තෑවයි ශත තිස්නවයක (රු. 15,139,670.39) ක මුදලක් 2009 අගෝස්තු මස 06 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පසළොස් මිලියන එකසිය තිස්නව දහස් හයසිය හැත්තෑවයි ශත තිස්නවයක (රු. 15,139,670.39) මුදල අයකර ගැනීම සඳහා 2009 අගෝස්තු මස 07 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,093,063.72 ක මුදල මත 29%ක වැඩිදුර වාර්ෂික පොලිය ද රු. 7,288,880ක මුදල මත 20% වැඩිදුර වාර්ෂික පොලිය ද සහ රු. 2,467,739.09 ක මුදල මත 12.75%ක වැඩි දුර වාර්ෂික පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද දරන ලද වෙනත් වියදම් වෙතොත් ඒවා ද මෙතෙක් ලබා ගෙන ඇති යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ඩෝප් විදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බලයලත් මානක ඒ. ආර්. සිල්වා විසින් 2002 ඔක්තෝබර් මස 06 වන දින සාදන ලද අංක 1340 දරන පිඹුරෙහි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාවන් තුල නාවල පාරේ වරිපනම් අංක 93/2ඒ හි පිහිටි කෝන්ගහවත්ත සහ අඹගහවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි සහ එහි මතුපිට පවත්නා අනෙකුත් සියළුදේත් සමග බෙදා වෙන්කර ලොට් 2 වශයෙන් සලකුණු කර දැක්වෙන ඉඩමට මායිම් උතුරට : ලොට් 1 සහ 3 ද, නැගෙනහිරට : පිඹුරුපත් අංක 6961 ලොට් සී සහ ටී. ජේ. බොතේජුගේ කුඹුර ද, දකුණට : ටී. ජේ. බොතේජුගේ කුඹුර ද සහ බටහිරට : පරණ පාරේ වරිපනම් අංක 93/3 දරන පරිශ්‍රය යන මායිම් තුළ එකී පිඹුරු පත් අංක 1340 පරිදි පර්චස් විසි එකයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 21.30) විශාල ඉඩම නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2935/244 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

මෙලෙස විස්තර කරනු ලබන බලයලත් මානක ඒ. ආර්. සිල්වා විසින් 2002.10.06 දින සාදන ලද පිඹුරු පත් අංක 1340 හි සඳහන් ලොට් 3 මතින් යාමේ අයිතිය ද සතුවය.

බලයලත් මානක ඒ. ආර්. සිල්වා විසින් 2002 ඔක්තෝබර් මස 06 වන දින සාදන ලද අංක 1340 දරන පිඹුර පරිදි එකී නාවල පිහිටි කෝන්ගහවත්ත සහ අඹගහවත්ත කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද අඩි 10ක් පළල මාර්ගයක් සඳහා වෙන්කරයක් වන ලොට් 3 ට මායිම් උතුරට : පාරේ වරිපනම් අංක 91/2, දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : පිඹුරුපත් අංක 1340 දැක්වෙන ලොට් 1 ද, දකුණට : පිඹුරුපත් අංක 1340 දැක්වෙන ලොට් 2 ද බටහිරට : වරිපනම් අංක 93/3 දරන පරිශ්‍රය සහ අඩි 10-20 පළල පාර ද යන මායිම් තුළ එකී අංක 1340 දරන පිඹුර පරිදි පර්චස් තුනයි දශම බිංදුවයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 3.02) විශාල ඉඩම නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3078/49 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-406

---

### මහජන බැංකුව - ඒකාබද්ධ බැංකු අංශය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2006.09.26 දිනැති අංක 1150 සහ 2005.02.17 දිනැති අංක 4535 දරන උකස්කර මත අයවිය යුතු මුදල් ගෙවීම සීමාසහිත එම්/එස්. ගාර්මට් ගෘප් 5 (පෞද්ගලික) ආයතනය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය මත තවදුරටත් පොළිය සමග රුපියල් හතලිස් දෙලක්ෂ පනස් එක්දහස් පන්සිය හැටදෙකක (රු. 4,251,562) මුදලක් මහජන බැංකුවට දැනට ලැබිය යුතුව සහ අයවිය යුතු බැවින් ද. 2008.10.15 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් හතලිස් දෙලක්ෂ පනස්එක් දහස් පන්සිය හැට දෙකක (රු. 4,251,562) මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි ගාස්තු ද එකී මහජන බැංකු පනතේ "29එල් " වගන්තිය යටතේ අයකරගත හැකි මුදල් ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් හතලිස් දෙලක්ෂ පනස් එක්දහස් පන්සිය හැටදෙක (රු. 42,51,562) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකරු වන එම්/එස් ෂොක්මන් සහ සමරවික්‍රම විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එල්. එම්. නාරන්ගොඩ විසින් ලියා අත්සන් කරන ලද අංක 1150 සහ ජී. ඒකනායක විසින් ලියා සහතික කරන ලද 4535 දරන එකී උකස්කරය මගින් බැංකුවට උකස්කර ඇති චංචල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උපලේඛනය**

එකී සියලුම යන්ත්‍රෝපකරණ එනම් :-

| *අයිතමය* | *ප්‍රමාණය* | *විස්තරය* | | |
|---|---|---|---|---|
| 01. | 10 | සිංගර් තනි ඉදිකටුව - මාදිලිය 191 | | |
| | | සංකේත අංක | U925107881 | U925207050 |
| | | | U925207417 | U925107340 |
| | | | U901107930 | U924907561 |
| | | | U892007844 | U925207049 |
| | | | U892507653 | U892007763 |
| 02. | 05 | සිංගර් තනි ඉදිකටුව - මාදිලිය 191 | | |
| | | සංකේත අංක | U892007836 | U900407989 |
| | | | U900407960 | U894407174 |
| | | | U892007793 | |
| 03. | 06 | සිංගර් තනි ඉදිකටුව - මාදිලිය 1191 | | |
| | | සංකේත අංක | U973631192 | U973631165 |
| | | | U07361190 | U973731053 |
| | | | U973731004 | U973731024 |
| 04. | 13 | බෙඩ් ට්‍රිරිමර්ස් තනි ඉදිකටුව යටතේ - ජුකී | | |
| | | මාදිලිය DDL 8500-7 | | |
| | | සංකේත අංක | 4 DOSE 06036 | 4 DOSE 06035 |
| | | | 4 DOSE 06044 | 4 DOSE 06033 |
| | | | 4 DOSE 05977 | 4 DOSE 05071 |
| | | | 4 DOSE 06045 | 4 DOSE 05999 |
| | | | 4 DOSE 06048 | 4 DOSE 06031 |
| | | | 4 DOSE 06032 | 4 DOSE 06030 |
| | | | 4 DOSE 06040 | |
| 05. | 13 | බෙඩ් ට්‍රිරිමර්ස් තනි ඉදිකටුව - ජුකී | | |
| | | මාදිලිය DDL 85007 | | |
| | | සංකේත අංක | 4 DOSD 04991 | 4 DOSD 05003 |
| | | | 4 DOSD 04996 | 4 DOSD 05017 |
| | | | 4 DOSD 05018 | 4 DOSD 04998 |
| | | | 4 DOSD 04997 | 4 DOSD 04994 |
| | | | 4 DOSD 04992 | 4 DOSD 05006 |
| | | | 4 DOSD 05000 | 4 DOSD 04999 |
| | | | 4 DOSD 04980 | |
| 06. | 02 | සිංගර් ද්විත්ව ඉඳිකටුව - මාදිලිය 212 (A141AAo) | | |
| | | සංකේත අංක | U 970512018 | U 923012049 |
| 07. | 02 | ජුකී ද්විත්ව ඉඳිකටුව - මාදිලිය LH3168/LH 515 | | |
| | | සංකේත අංක | DLMLE 39998 | DLMCE 39947 |
| 08. | 02 | එඩ්ජ් ට්‍රිර්මර්ස් තනි ජුකී ඉඳිකටුව - මාදිලිය DLM 5200N | | |
| | | සංකේත අංක | DLMCE 39998 | DLMCE 39947 |
| 09. | 06 | ජුකී ඕවර්ලොක් - මාදිලිය 3616/357 | | |
| | | සංකේත අංක | MOOBJ 51900 | B35756114 |
| | | | MOOBJ 92031 | B357N7675 |
| | | | MOOBJ 52020 | Y357M8687 |
| 10. | 03 | සිංගර් ඕවර්ලොක් - මාදිලිය 1841U | | |
| | | සංකේත අංකය | 972426440 | 972426407 |

| *අයිතමය* | *ප්‍රමාණය* | *විස්තරය* |
|---|---|---|
| 11. | 02 | ජුකී බොත්තම් සවිකරන - මාදිලිය MB372/LK1850<br>සංකේත අංකය Z372-14717 LKOYG 64152 |
| 12. | 02 | ජුකී බර්ටැක් යන්ත්‍ර - මාදිලිය LK1850<br>සංකේත අංකය 1850-P 21926 LKOUA 7429 |
| 13. | 01 | කන්ෂායි යන්ත්‍රය - මාදිලිය 1404P<br>සංකේත අංකය KS218956 |
| 14. | 02 | ස්නැප් බොත්තම් යන්ත්‍ර - මාදිලිය NS 47<br>සංකේත අංකය 252 253 |
| 15. | 02 | බොත්තම්කාස යන්ත්‍ර - මාදිලිය LBH 780/LBH 781U<br>සංකේත අංකය 781P-18885 LDHBF 32777 |
| 16. | 01 | පැලැට්ලොක් යන්ත්‍රය - මාදිලිය W8103F<br>සංකේත අංකය KS 146967 |
| 17. | 01 | නූල් පිරිසිදු කරන යන්ත්‍රය - මාදිලිය 55<br>සංකේත අංකය K040 |
| 18. | 01 | ෆසුසින් යන්ත්‍රය - මාදිලිය - HP45OJS<br>සංකේත අංකය 040798 |
| 19. | 02 | කැපීමේ යන්ත්‍රය - මාදිලිය - CAASS 629/CLASS 299X<br>සංකේත අංකය 6UA 904/5 2YJ1456-5 |
| 20. | 02 | පෝනි බේබි ස්ටීම් බොයිලර්ස්, ඉස්තිරික්ක දෙකක් සහිත<br>මේස දෙකක් - මාදිලිය P432/66<br>සංකේත අංකය K4235 K4226 |
| 21. | 02 | පෝනි බොයිලර්ස් - මාදිලිය GA 2/01P<br>සංකේත අංකය 134854 237898 |
| 22. | 04 | වැක්‍යුම් මේස - මාදිලිය 321<br>සංකේත අංක 308 309<br>280 283 |
| 23. | 02 | ක්ලෝත් පුලස් - මාදිලිය V 502 A 9<br>සංකේත අංකය 880178 880185 |
| 24. | 01 | එන්ඩ් කටර් - මාදිලිය V 432<br>සංකේත අංකය 9072382 |
| 25. | 01 | වායු සම්පීඩකය - මාදිලිය ENERGOL<br>සංකේත අංකය P 30/22 |
| 26. | 01 | කැපීමේ මේසය, දැව/උල්වූ කොන සහිත යකඩ රාමු<br>48'x4.5 |
| 27. | 01 | වැක්‍යුම් ක්ලීනර්ස් වර්ගය කාර්චර්<br>මාදිලිය NT-351-ECO |
| 28. | 01 | විලසන් ජෙනරේටර් - මාදිලිය P40<br>සංකේත අංකය DO 6950 003-40KVA |
| 29. | පද්ධති 1 | විද්‍යුත් සවිකිරීම්, පාලන පුවරුවේ ස්වීච්ලිවරය, රැහැන් |

මෙම බඳු ගිවිසුම ක්‍රියාත්මක වන කාලය තුළ දී කඩවත ගෝනහේන අංක 338/ඒ හි සීමාසහිත ගාර්මන්ට් ගෲප් 5 (පෞද්ගලික) ආයතනයේ කර්මාන්ත පරිශ්‍රයේ තබා ඇති හෝ වෙනත් යම් පරිශ්‍රයකට ගෙන යනු ලැබිය හැකි හෝ ඉවත් කරනු ලැබිය හැකි යන්ත්‍රෝපකරණ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ sa/cha 97/1061 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජොෂ්ඨ කළමනාකරු,
(පාරිභෝගික සම්බන්ධීකරණ - 3)

මහජන බැංකුව,
ඒකාබද්ධ බැංකු අංශය,
අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

06-350

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29(ඩී) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29(ඩී) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2009.01.30 වැනි දින පැවති ඔවුන්ගේ රැස්වීමේ දී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් මානෙල් පරණවිදාන සමරදිවාකර විසින් ලියා සහිතක කරන ලද අංක 106 හා 1993 ඔක්තෝබර් මස 08 වැනි දින දරන සහ සියල්ල කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඥානා ඒකනායක විසින් ලියා සහතික කරන ලද අංක 2518 හා 1998 සැප්තැම්බර් මස 11 වැනි දින දරන සහ අංක 4009 හා 2003 මාර්තු මස 19 වැනි දරන උකස් බැඳුම්කරය සහ අංක 3755 හා 2002 අප්‍රේල් මස 30 වැනි දින දරන අතිරේක බැඳුම්කර මත ගෙවිය යුතු මුදල් ගෙවීමට, ෂැන්කෙම් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති බැවින්, රුපියල් හය මිලියන හැත්තෑපන් දහස් හයසිය පනස් හතරයි ශත පහළොවක (රු. 60,75,654.15) මුදලක් එකී බැඳුම්කර මත පොළිය ද. සමග මහජන බැංකුවට දැන් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇත.

එකී රුපියල් හය මිලියන හැත්තෑපන් දහස් හයසිය පනස් හතරයි ශත පහළොව (රු. 60,75,654.15) ක මුදල සහ 2008 සැප්තැම්බර් මස 15 වැනි දින සිට විකුණුම් දිනය දක්වා රුපියල් තුන් මිලියන නවලක්ෂ පනස් හයදහස් හයයි ශත හැත්තෑහත (රු. 39,56,006.77)ක මුදලක මත වර්ෂයකට 17.5% වර්ෂයකට සියයට දහහතයි දශම පහ අනුපාතිකය සහ රුපියල් හත්ලක්ෂ දහනව දහස් හයසිය හතරයි ශත හතලිහ (රු. 7,19,604.40) මත වර්ෂයකට 22% (වර්ෂයකට සියයට විසි දෙක) අනුපාතිකයට සහ රුපියල් එක් මිලියන හාරලක්ෂ හතලිස් දෙකයි ශත අනූඅට (රු. 14,00,042.98) මත වර්ෂයකට 21% (වර්ෂයකට සියයට විසි එක) අනුප්‍රමාණයට තවදුරටත් පොළිය ද, සමග සහ විකුණුම් පිරිවැය සහ අනෙකුත් ගාස්තු, ඒ දක්වා කරන ලද ගෙවීම් කිසිවක් වේ නම්, අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 106, 2518 සහ 4009 දරන බැඳුම්කර සහ අංක 3755 දරන අතිරේක බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍ර බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, දකුණු අලුත්කුරු කෝරළේ, පෑලියගොඩ නගර සභා සීමාව තුළ පෑලියගොඩ අඛණ්ඩ සංවර්ධන යෝජනා ක්‍රමය තුළ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. එම්. කේ. බී. මාවලගෙදර විසින් මැන සාදන ලද අංක 8502-1 හා 1985.07.08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 18 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට සහ බස්නාහිරට : ලොට් 21, නැගෙනහිරට : ලොට් 19, දකුණට : ලොට් 4 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම එකයි පහ (අ. 0. රූ. 0, පර්. 13.15) හෝ හෙක්ටයාර් 0.03325 විශාල ඉඩම් කොටස සම්බන්ධයෙන් ඇති සියලු බදු හිමිකම් අයිතිවාසිකම් වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 831/128හි ලියාපදිංචි කර තිබේ.

02. ඉහත කී පෑලියගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. කේ. බී. මාවලගෙදර විසින් මැන සාදන ලද අංක 8502-1 හා 1985.07.08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 21 (ඇල දිගට ඇති වෙන් කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 8502-1 දරන එකී පිඹුරේ ලොට් 22 (ඇල සඳහා වෙන් කිරීම) නැගෙනහිරට : එකී පිඹුරේ දැක්වෙන ලොට් 110, දකුණට : එකී පිඹුරේ දැක්වෙන ලොට් 1, 4, 8, 10, 14, 15 එන් එස්. සහ 18 සිට 20 දක්වා කැබලි, බස්නාහිරට : පාර යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් දශම දෙකයි දෙක (අ. 1, රූ. 0, පර්. 0.22) විශාල ඉඩම් කොටස සම්බන්ධයෙන් ඇති සියලු බදු හිමිකම් අයිතිවාසිකම් වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 903/161 හි ලියාපදිංචි කර තිබේ.

03. ඉහත කී පෑලියගොඩ පිහිටි ඉහත කී අංක 8502-1 හා 1985.07.08 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 (අඩි 25ක් පළල පාරක් සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 3, 9, 10, 14, 15 සහ 18 සිට 21 දක්වා කට්ටි, නැගෙනහිරට : ලොට් 5, 8, 11, 13, 16 සහ 17 දරන කට්ටි, දකුණට : පාර සහ කාසි වෙට්ටිවත්ත සහ බස්නාහිරට : ලොට් 3, 9. 10, 14, 15 සහ 21 දරන කට්ටි යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි අටක් (අ. 0, රූ. 1, පර්. 28) හෝ හෙක්ටයාර් 0.17200 ක් විශාල ඉඩම් කොටස සම්බන්ධයෙන් ඇති සියලු බදු හිමිකම් අයිතිවාසිකම් වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී - 903/162හි ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
ආයතනික ණය 1.

06-348

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 376404, 376410, 376623, 387166, 165927, 194606 සහ 252656.
ගිණුම් අංකය : 1530004646.

2007 නොවැම්බර් මස 27 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එච්. කරුණාරත්න විසින් සහතික කරන ලද 2003.07.17 වැනි දින අංක 121 සහ 2006.09.01 වැනි දින අංක 797 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරයන් යටතේ (පළමුවැනි උපලේඛනයේ සඳහන් දේපළ) අනුරාධපුර පාර, තඹුත්තේගම සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන නිව් හෙළදිව ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් ද අනුරාධපුරය ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. එන්. ඩබ්. මාරසිංහ විසින් සහතික කරන ලද 2004.05.11 වැනි දින අංක 2195, 2005.08.09 වැනි දින අංක 2550, 2006.03.31 වැනි දින අංක 2942 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරයන් යටතේ (දෙවන උපලේඛනයේ සඳහන් දේපළ) අනුරාධපුර පාර, තඹුත්තේගම සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන නිව් හෙළදිව ට්‍රේඩ් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා මානප්පෙරු මුදියන්සේලාගේ කීර්ති බණ්ඩාර මානප්පේරු උකස්කරු වශයෙන් ද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දෙකෝටි අනූ දෙලක්ෂ අනූ හයදාස් හාරසිය විසි තුනයි ශත තිහක (රු. 29,296,423.30) මුදලක් 2009 ජූලි මස 23 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙකෝටි අනූ දෙලක්ෂ අනූ හයදහස් හාරසිය විසි තුනයි ශත තිහක (රු. 29,296,423.30) මුදල හා 2009 ජූලි මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,008,390.67ක මුදලක් සඳහා වාර්ෂිකව 29% බැගින් වූ පොළිය ද හා රු. 19,611,235ක මුදලක් සඳහා වාර්ෂිකව 28% බැගින් වූ පොළිය ද. ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සහ එකී අංක 121, 797. 2195, 2550 සහ 2942 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### පළමුවැනි උපලේඛනය

(1) වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තු තිරගන්දහය කෝරළේ, කුරුණෑගල නගර සභා සීමාව තුළ පුත්තලම පාරේ පිහිටි කොළොන්ගහමුලහේන නොහොත් කොලොන්ගහමුලවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. කේ. පෙරේරා විසින් 2001.11.12 වැනි දින සාදන ලද අංක 864 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 3 (බලයලත් මානක ඩබ්ලිව්. කේ. පෙරේරා විසින් 2001.10.07 වැනි දින සාදන ලද අංක 855 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් ඒ හි නැවත මැනීමක් හා අතුරු බෙදීමක් වන) දරන ඉඩමට මායිම් එනම් උතුර හා නැගෙනහිරට : කුරුණෑගල පුත්තලම මහා මාර්ගයෙන් ද, දකුණ සහ නැගෙනහිරට ඉහත කී පිඹුරු අංක 864හි නිරූපිත ලොට් 04න් ද, දකුණ සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864හි නිරූපිත ලොට් 18න් ද (මීටර් 3ක් පළල පාර) උතුර සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 නිරූපිත ලොට් 13න් ද (මීටර් 6ක් පළල පාර) යන මෙකී මායිම් තුළ ඉහත කී පිඹුරු අංක 864 ප්‍රකාරව පර්චස් හයයි දශම එකයි හතක් (අ. 0, රූ. 0, පර්. 6.17) විශාල ඉඩම හා එහි තුළ පිහිටි පුත්තලම පාර වරිපනම් අංක 303 සහ 309 දරන දේපළ ඇතුළු අනෙකුත් සියළු දේ. මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ ඒ1445/244 වෙළුම/පත්‍ර්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

02. පෙර කී කුරුණෑගල නගර සභා සීමාව තුළ කොලොන්ගහමුලහේන නොහොත් කොලොන්ගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. කේ. පෙරේරා විසින් 2001.11.12 වැනි දින සාදන ලද අංක 864 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 4 (බලයලත් මානක ඩබ්ලිව්. කේ. පෙරේරා විසින් 2001.10.07 වැනි දින අංක 855 දරන පිඹුරේ සඳහන් ලොට් ඒ නැවත මැනුමක් හා අතුරු බෙදීමක් වන) දරන ඉඩමට මායිම් එනම් උතුරු හා නැගෙනහිරට : කුරුණෑගල-පුත්තලම මහා මාර්ගයෙන් ද දකුණ සහ නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 864හි නිරූපිත ලොට් 5න් ද, දකුණ සහ බස්නාහිරට ඉහත කී පිඹුරු අංක 864 හි නිරූපිත ලොට් 18න් ද, (මීටර් 3ක් පළල පාර) උතුරු සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 නිරූපිත ලොට් 03 න් ද යන මෙකී මායිම් තුළ ඉහත කී පිඹුරු අංක 864 ප්‍රකාරව පර්චස් හයයි දශම පහයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.51) විශාල ඉඩම හා එහි තුළ පිහිටි පුත්තලම පාර වරිපනම් අංක 303 සහ අංක 309 දරන දේපළ ඇතුලු අනෙකුත් සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ ඒ 1445/245 වෙළුම/පත්‍ර්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

03. පෙර කී කුරුණෑගල නගර සභා සීමාව තුළ කොලොන්ගහමුලහේන නොහොත් කොලොන්ගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. කේ. පෙරේරා විසින් 2001.11.12 වැනි දින සාදන ලද අංක 864 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 5 (බලයලත් මානක ඩබ්ලිව්. කේ. පෙරේරා විසින් 2001.10.07 වැනි දින සාදන ලද අංක 855 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් ඒ නැවත මැනුමක් හා අතුරු බෙදීමක් වන) දරන ඉඩමට මායිම් එනම් උතුරු හා නැගෙනහිරට : කුරුණෑගල-පුත්තලම මහා මාර්ගයෙන් ද දකුණ සහ නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 864හි නිරූපිත ලොට් 6න් ද, දකුණ සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 හි නිරූපිත ලොට් 18න් ද, (මීටර් 3ක් පළල පාර) උතුරු සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 නිරූපිත ලොට් 04 න් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම හයයි හතක් (අ. 0, රූ. 0, පර්. 6.67) විශාල ඉඩම හා එහි තුළ පිහිටි පුත්තලම පාර වරිපනම් අංක 303 සහ අංක 309 දරන දේපළ ඇතුලු අනෙකුත් සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ ඒ 1445/246 වෙළුම/පත්‍ර්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ඩබ්ලිව්. කේ. පෙරේරා විසින් සාදන ලද අංක 912 දරන පිඹුරේ ඉහත කී ඉඩම් ඒකාබද්ධ කොට පහත සඳහන් පරිදි විස්තර කර ඇත

ඉහත කී කුරුණෑගල නගර සභා සීමාව තුළ කොලොන්ගහමුලහේන නොහොත් කොලොන්ගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. කේ. පෙරේරා විසින් 2003.02.12 වැනි දින සාදන ලද අංක 912 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් A (2001.11.12 වැනි දින සාදන ලද අංක 864 පිඹුරේ නිරූපිත ලොට් 3, 4, 5 දරන ඉඩම් වලින් ඒකාබද්ධ වී සෑදුණු) නැමති ඉඩමට මායිම් එනම් උතුරු හා නැගෙනහිරට : කුරුණෑගල-පුත්තලම මහා මාර්ගයෙන් ද දකුණ සහ නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 864හි නිරූපිත ලොට් 6න් ද, දකුණ සහ බස්නාහිරට

: ඉහත කී පිඹුරු අංක 864 හි නිරූපිත ලොට් 18න් ද, (මීටර් 3ක් පළල පාර) උතුරු සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 නිරූපිත ලොට් 13 න් ද (මීටර් 6ක් පළල පාර) යන මෙකී මායිම් තුළ ඉහත කී පිඹුරු අංක 864 ප්‍රකාරව පර්චස් දහනවයයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 19.35) විශාල ඉඩම හා එහි තුළ පිහිටි පුත්තලම පාර වරිපනම් අංක 303 සහ අංක 309 දරන දේපළ ඇතුලු අනෙකුත් සියලු දේ.

පහත විස්තර කර ඇති ඉහත කී පිඹුරු අංක 864 නිරූපිත ලොට් 13 සහ ලොට් 18 දරන මාර්ග ප්‍රවේශයෙන් උඩින් තුළින් සහ ඔස්සේ පාවිච්චි කිරීමේ අයිතිය ද සමග වේ.

(1) පෙර කී කුරුණෑගල නගර සභා සීමාව තුළ කොලොන්ගහමුලහේන නොහොත් කොලොන්ගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. කේ. පෙරේරා විසින් 2001.11.12 වැනි දින සාදන ලද අංක 864 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 13 (මීටර් 6ක් පළල පාර) දරන ඉඩමට මායිම් එනම් උතුරු හා නැගෙනහිරට : කුරුණෑගල-පුත්තලම මහා මාර්ගයෙන් ද ඉහත කී පිඹුරු අංක 864 සඳහන් ලොට් අංක 40. 39, 25, 38 සහ 37න් ද දකුණ සහ නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 864හි නිරූපිත ලොට් 11, 15, 28, 29, 30, 41, 42, 37, 34, 23, 20, 03 සහ 18 (මීටර් 3ක් පළල පාර) න් ද, දකුණ සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 හි නිරූපිත ලොට් 43න් ද, (මීටර් 4.5ක් ප්‍රවේශය) 46, 47, 48, 49 සහ 50න් ද උතුරු සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 නිරූපිත ලොට් අංක 10, 18 (මීටර් 3ක් පළල පාර) 16, 27, 31, 40. 51, 36, 35, 22, 21 සහ 2න් ද යන මෙකී මායිම් තුළ රූඩ් එකයි පර්චස් විසිඑකයි දශම හතරයි එකයි (අ. 0, රූ. 1, පර්. 21.41) විශාල ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් කාර්යාලයේ A1445/232 වෙළුම/පත්‍ඉරුවේ ලියාපදිංචි කර ඇත.

(2) ඉහත කී කුරුණෑගල නගර සභා සීමාව තුළ කොලොන්ගහමුලහේන නොහොත් කොලොන්ගහමුල වත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. කේ. පෙරේරා විසින් 2001.11.12 වැනි දින සාදන ලද අංක 864 දරන පිඹුරේ නිරූපිත ලොට් 18 (මීටර් 3ක් පළල පාර) නමැති ඉඩමට මායිම් එනම් උතුරු හා නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 864 සඳහන් ලොට් අංක 3, 4. 5, 6, 7, 8, 9 සහ 10න් ද දකුණ සහ නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 864හි සඳහන් ලොට් අංක 13 (මීටර් 6ක් පළල පාර) න් ද, දකුණ සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 හි නිරූපිත ලොට් අංක 16, 17, 19 සහ 20න් ද උතුරු සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක 864 නිරූපිත ලොට් අංක 16 (මීටර් 6ක් පළල පාර) න් යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 6.2) විශාල ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ A1445/281 වෙළුම/පත්‍ඉරුවේ ලියාපදිංචි කර ඇත.

## දෙවැනි උපලේඛනය

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම්පළාත කනදර කෝරළේ, අනුරාධපුර නගර සභා සීමාවත් තුළ නව නගරය පියවර 1හි පිහිටි පොත්නවරන්කුලමකැලේ නමැති ඉඩමට බලයලත් මානක ඩී. එම්. ජී. දිසානායක විසින් 1991.08.11 වැනි දින අංක 3007 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 1 (F. U. P. A 2 හි සඳහන් ලොට් 439හි නැවත මැනුමක් වන) දරන ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : ඉහත කී පිඹුරු අංක A2හි සඳහන් ලොට් 438 දරන වරිපනම් අංක 156 දේපලෙන් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක A2හි සඳහන් ලොට් 218 පාර ද (ප්‍රධාන පාර) දකුණට : ඉහත කී පිඹුරු අංක A2හි සඳහන් ලොට් 440 දරන වරිපනම් අංක 160 න් ද සහ බස්නාහිරට : ඉහත කී පිඹුරු අංක A2හි සඳහන් ලොට් 432 පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි මෛත්‍රීපාල සේනානායක මාවත වරිපනම් අංක 158 දරන දේපළ (කඩ අංක 123) ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියළු දේ. ඉහත කී පිඹුරු අංක 3007 ප්‍රකාරව ඉඩමේ ප්‍රමාණය පර්චස් හතරයි දශම හතරයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 4.42) විශාල ඉඩම. මෙය අනුරාධපුර ඉඩම් කාර්යාලයේ A396/73 වෙළුම/පත්‍ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. ආර්. දූනුවිල,
සමාගම් ලේකම්.

06-395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.